පස්වන කොටස

අද ඕස්ට්‍රේලියාව

අද ඕස්ට්‍රේලියාව

මෙම කොටසේදී, ඔබට ඕස්ට්‍රේලියාවේ සංස්කෘතිය, නව නිපැයුම් සහ ජාතික අනන්‍යතාව පිළිබඳව දැනගත හැකිය. ඕස්ට්‍රේලියාව විවිධත්වයෙන් යුත් ව්‍යාපාරික සහ වෙළඳ පාර්ශ්වකරුවෙකු මෙන්ම ගෞරවාන්විත ගෝලීය පුරවැසියෙකුද වන්නේය. රටේ අඛණ්ඩ වර්ධනය සහ නවීනත්වය වෙනුවෙන් නව සංක්‍රමණිකයින්ගේ දායකත්වය ඕස්ට්‍රේලියානුවෝ අගය කරති.

භූමිය

ඕස්ට්‍රේලියාව ලෝකයේ පැරණිතම භූමි කොටස්වලින් එකකි එය ලෝකයේ සයවෙනි විශාලතම දේශය සහ විශාලතම දිවයින සහිත ජාතිය වේ. එය මිනිසුන් ජීවත්වන පැතලිතම සහ වියළිතම භූමිභාගයද වේ. ඕස්ට්‍රේලියාවේ වැඩි භූමි ප්‍රමාණයක් වගාකිරීමට අපහසු වන පරිදි නිසරු පසකින් සමන්විත වනවාක් මෙන්ම ඊට ඇදහැලෙන වර්ෂාවද ඉතා අඩුය. අභ්‍යන්තර වියළි ප්‍රදේශ ග්‍රාමීය ප්‍රදේශ නමින් හැඳින්වෙන අතර, ඒවා සුවිශේෂීව දුරස්ථ සහ කටුක පරිසරවලින් යුක්තය. ඕස්ට්‍රේලියාවේ ජලය ඉතාමත් වටිනා සම්පතකි.

විශාල රටක් ලෙස, ඕස්ට්‍රේලියාවේ තරමක් වෙනස් කාලගුණ තත්ත්වයන් සහිත කලාප පිහිටා ඇත. උතුරු ඕස්ට්‍රේලියාව ඝර්මකලාපීය ප්‍රදේශයක් වන අතර, මධ්‍යයේ කාන්තාර පිහිටා ඇත. දකුණු කොටසේ උෂ්ණත්වය, හිමවලින් පිරි කඳු දිස්වෙන ශීත කාලයේ සිට වියළි උණුසුම් තාපධාරා හමා යන ග්‍රීෂ්ම ඍතුව දක්වා වෙනස් විය හැකිය.

ප්‍රාන්ත හයට හා ප්‍රධාන ටෙරිටරි දෙකට අමතරව, ඕස්ට්‍රේලියානු රජය විසින් පහත සඳහන් ටෙරිටරිද පරිපාලනය කරයි:

- ඈෂ්මෝර් සහ කාර්ටියර් දූපත්
- ක්‍රිස්මස් දූපත
- කොකොස් දූපත් (කීලිං) දූපත්
- ජර්විස් බේ ටෙරිටරි
- කොරල් සී දූපත්
- ඕස්ට්‍රේලියානු ඇන්ටාර්ක්ටික් ටෙරිටරියේ පිහිටි හර්ඩ් දූපත සහ මැක්ඩොනල්ඩ් දූපත්
- නෝර්ෆෝක් දූපත

ලෝක උරුම අඩවි

පහත සඳහන් ඕස්ට්‍රේලියානු අඩවි එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානයේ (UNESCO) ලෝක උරුම අඩවි ලැයිස්තුවේ දක්වා ඇත.

සංස්කෘතික

- ඕස්ට්‍රේලියානු රැඳවියන්ගේ අඩවි
- බුජ් බිම් සංස්කෘතික භූමිභාගය
- මෙල්බර්න්හි පිහිටි රාජකීය ප්‍රදර්ශන ගොඩනැගිල්ල සහ කාල්ටන් උද්‍යානය
- සිඩ්නි ඔපෙරා හවුස්

සිඩ්නි ඔපෙරා හවුස්

ස්වාභාවික

- දකුණු ඕස්ට්‍රේලියාවේ හා ක්වීන්ස්ලන්තයේ ඕස්ට්‍රේලියානු ක්ෂීරපායී පොසිල අඩවි
- කේ'ගාරි (කලින් ෆ්‍රේසර් දූපත)
- ඕස්ට්‍රේලියාවේ ගොන්ඩ්වානා වැසි වනාන්තර
- මහා බාධක පර ය
- ග්‍රේටර් බ්ලූ මවුන්ටන් ප්‍රදේශය
- හර්ඩ් සහ මැක්ඩොනල්ඩ් දූපත්
- ලෝර්ඩ් හව් දූපත් සමූහය
- මැක්වරි දූපත
- නින්ග්ලූ වෙරළ තීර ය
- පූර්නුලුලු ජාතික වනෝද්‍යානය
- ශාර්ක් බේ, බටහිර ඕස්ට්‍රේලියාව
- ක්වීන්ස්ලන්තයේ තෙත් වැසි වනාන්තර

මිශ්‍ර

- කකඩු ජාතික උද්‍යානය
- තස්මේනි යානු ඝන වනාන්තර
- උලුරු-කාටා යුටා ජාතික උද්‍යානය
- විලන්ඩ්රා ලේක්ස් කලාප ය

උලුරු-කාටා ජාතික වනෝද්‍යානයේ අ යර්ස් රොක් බේස්හි රළු හැඩැති ශෛල සැකැස්ම

ඉහත සඳහන් බටහිර සංකේත සහ ස්වාභාවික අරුම යන්ට අමතරව, ආදිවාසීන්ට වැදගත් වන ශුද්ධ භූමි රැසක්පු දේශය පුරා පිහිටා ඇත.මේ අඩවි ඕස්ට්‍රේලියාවේ සංස්කෘතික සැකැස්මෙහි වැදගත් කොටසක් වන අතර, සි යලුම ඕස්ට්‍රේලියානුවන් හට වැදගත් වේ. පූජනී ය අඩවි මුතුන්මිත්තන්ගේ පුරාවෘත්ත යන්ට සම්බන්ධතාවක් දක්වන අතර, විශාල භූමිභාග යක් නිර්මාණ ය කිරීමෙහි ලා, සංස්කෘතික සාරධර්ම, මිත්‍ර සම්බන්ධතා සහ සමාජ නි යම ය ස්ථාපිත කිරීමෙහි ලා එහි භූමිකාව හා සම්බන්ධ වේ.

විශාල රටක්

ආදිවාසීන්ට මෙම භූමි ය සමඟ විශේෂ සම්බන්ධතාවක් ඇත. ඔවුහු සෑමවිටම සි ය අසල්වැසි යන් සමඟ සම්බන්ධතා පැවැත්වීම අග ය කරන ලද අතර, ඔවුන් මුණගැසීමට ඉතා දුර සංචාර ය කරති. ආදිවාසීන්ගේ ගී පද ඕස්ට්‍රේලියාව පුරා විහිද ඇති විවිධ සංස්කෘතික හා භාෂා කණ්ඩා යම්වල භූගෝලීය මට්ටම් සමඟ සාම්ප්‍රදායික නීති ය, ඉතිහාස ය සහ සංස්කෘති ය සම්බන්ධ කෙරෙන වෘත්තාන්ත යන් වේ. ඒවා වසර දහස් ගණනක් පුරා පවත්වාගෙන, පුහුණු කෙරේ.

ඕස්ට්‍රේලියාවේ බොහෝ කොටස්වල ජනතාවට අනෙක් ඕස්ට්‍රේලියානුවන් තමන්ට ලැබි ය යුතු යැයි සිතන පාසැල්, සුව සේවාවන් සහ වෙළඳසැල් වැනි සේවාවන් ලබාගැනීමට සීමිත ඉඩකඩ ඇත. දුරස්ථප්‍රදේශවල ජීවත් වන ජනතාවට උපකාර කිරීම සඳහා අපි එක්ව වැඩ කරමු. අවධාන යට ලක්වූ ඕස්ට්‍රේලියානුවෝ දක්ෂතාව ය සහ නව නිපැයුම් මගින් දුරස්ථභාව ය පිළිබඳ ගැටලු විසඳීමට උපකාරී වී ඇත.



තස්මේනියානු ඝන වනාන්තර

පෙඩල් ගුවන් විදුලිය

1929දී, ඇඩිලේඩ් හි සිට පැමිණි ඇල්ෆ්‍රඩ් ට්‍රේගර් විසින් පෙඩලය භාවිතයෙන් බලගන්වන ලද පළමු ගුවන් විදුලිය නිර්මාණය කරන ලදී. මෙය භාවිත කරන්නන් විසින් සිය පාදයෙන් පෙඩල තල්ලු කිරීම මගින් ද්වි-මාර්ග රේඩියෝවක් ලෙස භාවිත කරන ලදී. මේ නව නිපැයුමෙන් නිවෙස්වල තනිව සිටි අය, දුරස්ථ මෙහෙයුම් සේවාස්ථානවල සිටි පුද්ගලයෝ සහ ආදිවාසී ප්‍රජාව යන සියලුමදෙනා ප්‍රයෝජන ලදහ. රාජකීය ගුවන් වෛද්‍ය සේවාව සහ ගුවන් පාසල යන ශ්‍රේෂ්ඨ ඕස්ට්‍රේලියානු ආයතන දෙක ස්ථාපිත කිරීම සඳහා පෙඩල් ගුවන් විදුලිය උපකාරී විය.

රාජකීය ගුවන් වෛද්‍ය සේවාව

පූජ්‍ය ජෝන් ෆ්ලින් දුරස්ථ පෙදෙස්වල ජනතාව සමග ජීවත් වී, වැඩ කළේය. ග්‍රාමීය පෙදෙස්වල රෝගීන් වෙත හැකි ඉක්මණින් වෛද්‍යවරුන් රැගෙන ඒමට ඔහුට අදහසක් තිබිණි. මෙය යථාර්ථයක් බවට පත් කිරීමට, ඔහු රජයෙන්, කොන්ටාස් ගුවන් සේවයෙන් සහ පුණ්‍යායතනවලින් උදව් ඉල්ලා සිටියේය. රාජකීය ගුවන් වෛද්‍ය සේවාව 1928දී ආරම්භ කරන ලද නමුත්, ග්‍රාමීය ප්‍රදේශවල මෙම සේවය ඇමතීමට නොහැකි පුද්ගලයෝ සිටියහ. තනි වූ ප්‍රජාවන්හි ජනතාවට හැකිතාක් ඉක්මණින් වෛද්‍යවරයෙකු ඇමතීමට හැකි බව පෙඩල් ගුවන් විදුලිය හඳුන්වාදීම මගින් තහවුරු කෙරිණි.

ගුවන් පාසැල

1925වන තෙක්, තනි වූ ස්ථානයන්හි ජීවත් වූ දරුවන්ට නේවාසික පාසලකට යාමට හෝ තැපැල් මගින් සිය පාඩම් සම්පූර්ණ කිරීමට සිදු විය. (පින්තූර ඉහළින් දක්වා ඇත) දකුණු ඕස්ට්‍රේලියාවේ රාජකීය ගුවන් වෛද්‍ය සේවාවේ උප සභාපති ඇඩිලේඩ් මිත්කේට මෙම සේවාව මගින් නිවෙස්වල සිටින දරුවන්ට සිය ගුරුවරුන් සමඟ කථා කිරීමට ද උපකාර කළ හැකි බව අවබෝධ විය. 1948දී ඇලිස් ස්ප්‍රින්ග් සේවාව විසින් ද්විත්ව මාර්ග පාඩම් ගුවනට මුදාහැරීම ආරම්භ කරන ලදී. ඉන් වසර කිහිපයකට පසුවගුවන් පාසැල විධිමත් ලෙස ස්ථාපනය කරන ලදී. මෙවැනි වැඩසටහන් සිය රටවල ස්ථාපනය කිරීමට ඕස්ට්‍රේලියාවේ අත්දැකීම් බොහෝ රටවලට උපකාරී විය.

පැරණි පෙඩල් ගුවන් විදුලිය වෙනුවට අධි සංඛ්‍යාත ගුවන් විදුලි සම්ප්‍රේෂක භාවිත කෙරෙන අතර, දැන් ඒ වෙනුවට අන්තර්ජාලය භාවිත කෙරේ. ඕස්ට්‍රේලියාවේ රාජකීය ගුවන් වෛද්‍ය සේවාව සහ ගුවන් පාසැල මෙම දේශයේ දුරස්ථ ප්‍රජාවන්හි ජනතාවට සේවය කිරීමට සහ ප්‍රතිලාභ ලබා දිමට අඛණ්ඩව කටයුතු කරයි.

ඕස්ට්‍රේලියාවේ අනන්‍යතාවය

අපගේ ආදිවාසී උරුමය සහ සංස්කෘතීන්, අපගේ ජනතාවගේ විවිධත්වය, අපේ ඉතිහාසය, අපගේ එදිනෙදා ජීවිතයට මගපෙන්වන සාරධර්ම, අපගේ ජීවන රටාවන් හා අප අගය කරන ඕස්ට්‍රේලියානුවන් ඇතුළු බොහෝ කරුණු මගින් ඕස්ට්‍රේලියාවේ අනන්‍යතාව හැඩගැසී ඇත.

6 වන කොටස, අපගේ ඕස්ට්‍රේලියානු වෘත්තාන්තය මගින් අපගේ ඉතිහාසය දෙස අවධානය යොමු කෙරේ. මෙමගින් ඕස්ට්‍රේලියාවේ යටත්විජිත අතීතය සහ ආදිවාසීන්ගේ මෑතකාලීන හා වර්තමාන සිදුවීම් පිළිබඳව අවධාරණය කෙරේ. මෙම වෘත්තාන්තය තුළ ඕස්ට්‍රේලියාවේ විවිධාකාර, බහුසංස්කෘතික මූලයන් සහ ස්වභාවයන් හා ජාතියක් ලෙස අප මුහුණ දී ඇති යුද්ධ වැනි අභියෝග පිළිබඳව ද ඇතුළත්ය.

මෙම පරිච්ඡේදයේ ඉතිරි කොටස තුළ අප අනුගමනය කරන ජීවන රටාවන් සහ අප අගය කරන පුද්ගලයින් දෙස අවධානය යොමු කෙරේ.

ක්‍රීඩා සහ විනෝදාත්මක ක්‍රියාකාරකම්

බොහෝ ඕස්ට්‍රේලියානුවන් ක්‍රීඩාවලට ඇලුම් කරන අතර, ඕස්ට්‍රේලියානු ක්‍රීඩකයින් ජාත්‍යන්තර මට්ටම්වල විශිෂ්ට ජයග්‍රහණ ලබා ඇත.

අපගේ ඉතිහාසය පුරාම, ක්‍රීඩා මගින් ඕස්ට්‍රේලියානු ජනතාව එකතු කිරීම මෙන්ම වටිනාකම් එක් කර ඇත. මුල් පදිංචි කරවීමේ සිට ක්‍රීඩාව මගින් කටුක පැවැත්මේ යථාර්ථයෙන් පලා යාමට අවස්ථාව සලසා දී ඇත. යුධ සමයන්හිදී පවා, ඕස්ට්‍රේලියානු ආරක්ෂක අංශවල සාමාජිකයින් යුධබිමේ පීඩනය මගහරවාගැනීම උපකාරී වන ලෙස ක්‍රීඩා තරඟ සංවිධානය කරන ලදී.

ක්‍රීඩාව, ක්‍රීඩකයින්ට සහ ප්‍රේක්ෂකයින්ට එහි කොටසක් ලෙස සහ සමාජයට වැදගත් යම් කරුණක කොටසක් ලෙස හැඟී යාමට ඉඩ සලසන පොදු කරුණක් ද සපයයි. රටේ වඩාත්ම සාර්ථක ක්‍රීඩකයින් අතර ආදිවාසී සහ සංක්‍රමණික ඕස්ට්‍රේලියානුවෝ සිටිති.

බොහෝ ඕස්ට්‍රේලියානුවෝ ක්‍රිකට්, පැසිපන්දු, දැල්පන්දු හා හොකී වැනි කණ්ඩායම් ක්‍රීඩාවල නිරත වෙති. ෆුට්බෝල් කෝඩ්ස් ඔෆ් සොකර්, රග්බි ලීග්, රග්බි යූනියන් සහ ආවේණික ඕස්ට්‍රේලියානු ෆුට්බෝල් මෙම දේශයේ ක්‍රීඩා කරන සහ නරඹන වඩාත් ජනප්‍රිය ක්‍රීඩාවන් වේ. පිහිනීම, ටෙනිස්, මලල ක්‍රීඩා, ගොල්ෆ්, බයිසිකල් පැදීම, කඳු නැගීම, දිය මත ලිස්සා යාම සහ හිම මත යාම ද ජනප්‍රිය විනෝදාත්මක ක්‍රියාකාරකම් ය.

ඕස්ට්‍රේලියාව ක්‍රිකට් ක්‍රීඩාවෙන් ලබා ඇති ජාත්‍යන්තර සාර්ථකත්වය පිළිබඳ විශේෂයෙන් ආඩම්බර වේ. 19වන සියවසේ අග සිට ඕස්ට්‍රේලියානු හා එංගලන්ත ක්‍රිකට් කණ්ඩායම් දැඩි ප්‍රතිවාදීන් වී ඇත.

මෙල්බර්න් කප් 'the race that stops the nation', ලෝකයේ විශාලතම තුරඟ තරඟවලින් එකකි. පළමු මෙල්බර්න් කප් තරඟය 1861දී පැවැත්විය. මෙල්බර්න් කප් තරඟය නොවැම්බර් මාසයේ පළමු අඟහරුවාදා දින පැවැත්වෙන අතර, 1877 සිට එදින වික්ටෝරියා ප්‍රාන්ත රජයේ නිවාඩු දිනයක් බවට පත්වී ඇත.

ශ්‍රීමත් ඩොනල්ඩ් බ්‍රැඩ්මන් (1908-2001)

සර්ව කාලීන ශ්‍රේෂ්ඨතම පිතිකරුවා වන වන ශ්‍රීමත් ඩොනල්ඩ් බ්‍රැඩ්මන් ඕස්ට්‍රේලියානු ක්‍රීඩා පුරාවෘත්තයකි. ඔහු නිව් සවුත් වේල්සයේ බොව්රල්හි හැදී වැඩුණු අතර, ඕස්ට්‍රේලියාව වෙනුවෙන් සිය ප්‍රථම තරඟය 1928දී ක්‍රීඩා කළේය.

ඔහුගේ පාද විශ්මයජනක ලෙස ඉතා වේගවත් විය. 1930 ඔහුගේ ප්‍රථම එංගලන්ත සංචාරයේදී, ඔහු ආසන්න වශයෙන් සියලුම පිතිකරණ වාර්තා බිඳ හෙලීය. වයස අවුරුදු 21වන විට, ඔහු ඕස්ට්‍රේලියානු පුරාවෘත්තයක් බවට පත්වී හමාරය. 1948 ඔහුගේ අවසන් සංචාරයේදී, ඔහුගේ කණ්ඩායම ඉන්වින්සිබල් යනුවෙන් හැඳින්වූයේ, එංගලන්තයට එරෙහිව ක්‍රීඩා කළ කිසිදු තරඟයක් ඔවුන් පරාජය නොවූ හෙයිනි.

කලාවන්

ජාතියේ ආදිවාසීන්ගේ සංස්කෘතික සම්ප්‍රදායන් ඇතුළත් විශිෂ්ට කලාවන් ඕස්ට්‍රේලියාව සතුය. චිත්‍රපට, වේදිකාව, සංගීතය හා නර්තන ඇතුළු ඕස්ට්‍රේලියානු දෘශ්‍ය හා රංග කලා ශිල්පීන් මෙරට මෙන්ම විදේශයන්වලද මහත් සේ ඇගයීමට ලක් වේ.

සාහිත්‍යය

ඕස්ට්‍රේලියාවට ශක්තිමත් සාහිත්‍ය සම්ප්‍රදායක් ඇත. මෙය, ආදිවාසීන්ගේ කථාන්තර කීමේ කලාවත් සමඟ ආරම්භ වූ අතර, 18වන සියවසේ අග කාලයේදී පැමිණි රෑදවියන්ගේ වාචික කථා සමඟ දිගටම පැවතිණි.

මුල් කාලයේ ඕස්ට්‍රේලියානු ලිවීම් බොහොමයක් කැළෑ සහ එවැනි කටුක පරිසරයක ජීවත්වීමේදී විඳීමට සිදුවන දුෂ්කරතා පිළිබඳ ඇතුළත් විය. හෙන්රි ලෝසන් සහ මයිල්ස් ෆ්‍රැන්ක්ලින් වැනි ලේඛකයින් කැළෑ සහ ඕස්ට්‍රේලියානු දිවිය පිළිබඳව කවි සහ කථා ලියන ලදී.

පැට්‍රික් වයිට් නම් ඕස්ට්‍රේලියානු නවකථාකරුවාට 1973දී සාහිත්‍යය සඳහා පිරිනමන නොබෙල් ත්‍යාගය හිමි විය. වෙනත් ජනප්‍රිය නූතන ඕස්ට්‍රේලියානු ගත්කතුවරුන් වන්නේ පීටර් කේරි, කොලීන් මැකලෝ, සැලී මෝර්ගන්, ටිම් වින්ටන්, ටොම් කිනීලි සහ බ්‍රයිස් කර්ට්නි යන අයයි.

ජුඩිත් රයිට් (1915-2000)

ජුඩිත් රයිට් යනු විශිෂ්ට කිවිඳියක්, සංරක්ෂණවාදියෙක් මෙන්ම ආදිවාසීන්ගේ අයිතීන් වෙනුවෙන් සටන් කළ අයෙකි. ඇය ඕස්ට්‍රේලියාව සහ එහි ජනතාව වෙනුවෙන් ඇගේ ප්‍රේමය කවිවලින් ප්‍රකාශ කළාය. සාහිත්‍යය සඳහා එන්සයික්ලොපීඩියා බ්‍රිටැනිකා ත්‍යාගය සහ කවි කලාව සඳහා රැජිණගේ රන් පදක්කම ඇතුළු බොහෝ ත්‍යාගයන්ගෙන් ඇය පිදුම් ලැබුවාය. ඇය ඕස්ට්‍රේලියානු සංරක්ෂණ කමිටුවේ සහ ආදිවාසී කමිටුවේ සාමාජිකයෙකු ද වූවාය.

ජුඩිත් රයිට් කිවිඳියක ලෙස ඇගේ කුසලතාවටද ඕස්ට්‍රේලියානු සාහිත්‍යය වැඩිදියුණු කිරීම හා සමාජීය සහ පාරිසරික ප්‍රතිසංස්කරණ වෙනුවෙන් සිහිපත් කෙරේ.

වේදිකාව සහ චිත්‍රපටි

ඕස්ට්‍රේලියානු වේදිකා නාට්‍ය, චිත්‍රපටි සහ නිර්මාණකරුවන් මෙරට මෙන්ම විදේශයන්වලද පිළිගැනීමට ලක් වේ. කේට් බ්ලොන්ෂෙත්, ජොෆ්රි රෂ්, නිකොල් කිඩ්මන් සහ හියු ජැක්මන් වැනි ඕස්ට්‍රේලියානු රංගන ශිල්පීන් මෙන්ම පීටර් වෙයර් සහ බස් ලුඅර්මන් වැනි සිනමාකරුවන් සිය සිනමා විශිෂ්ටත්වය උදෙසා අන්තර්ජාතික සම්මාන රැසකින් පිදුම් ලබා ඇත.

දෘශ්‍ය කලා

වඩාත් ජනප්‍රිය ඕස්ට්‍රේලියානු දෘශ්‍ය කලාවන් අතරට සංකේතාත්මක ආදිවාසි චිත්‍ර හා ටොම් රොබර්ට්ස්, ෆෙඩ්රික් මැකබින් සහ ආතර් ස්ට්‍රිටන් වැනි චිත්‍ර ශිල්පීන්ගේ 19වන සියවසේ කැළෑ පිළිබඳ සිතුවම් ඇතුළත් වේ. 20වන සියවසේ මැදදී, රසල් ඩ්‍රයිස්ඩේල් සහ සිඩ්නි නෝලන් වැනිශිල්පීන් ග්‍රාමීය ප්‍රදේශවල දුෂ්කරතාවන් පැහැදිලි වර්ණවලින් මතුකර දක්වන ලදී. මෑත කාලයේදී, බ්‍රෙට් වයිට්ලි සිය ආවේණික හා විවිධත්වයෙන් යුතු ශෛලිය වෙනුවෙන් අන්තර්ජාතික වශයෙන් සම්මානයට පාත්‍ර විය. ඇල්බර්ට් නමජිරා, එමිලි කෙම් වරායී, ග්ලෝරියා පෙට්යාර්, රෝවර් තෝමස් සහ ක්ලිෆර්ඩ් පොසම් විසින් නිර්මාණය කරන ලද ආදිවාසී කලාවන් සඳහා මෙරට මෙන්ම විදේශයන්වලද ඉහළ ඉල්ලුමක් ඇත.

සංගීතය හා නර්තනය

ඉතා ඉක්මණින් හඳුනාගත හැකි ඕස්ට්රේලියානු සංගීත නාදය වන්නේ ඓතිහාසික ආදිවාසී සංගීත භාණ්ඩයක් වන ඩිගෙරිඩූහි නාදයයි.

ඕස්ට්රේලියානුවන් සියලුම ආකාරයේ සංගීත ශෛලීන් වැළඳගන්නා සේම එම ශෛලීන්හි විශිෂ්ටත්වයට පත්ව ඇති අතර, ශාස්ත්රීය, ගැමි හා රොක් සංගීතය වෙනුවෙන් සිය දායකත්වය ජාත්යන්තර වශයෙන් පිළිගැනීමට ලක්ව ඇත.

ජනප්රිය ඕස්ට්රේලියානු සංගීතඥයින් අතරට කයිලි මිනෝග්, ජිමී බාර්න්ස්, පෝල් කෙලී, ඔලිවියා නිව්ටන්-ජෝන්, ජෝන් ෆාර්න්හැම්, නික් කේව් හා ආදිවාසී ශිල්පීන් වන ආර්චි රෝච් සහ ජෙසිකා මෝබෝයි ඇතුළත් වේ. ඒසී/ඩීසී සහ INXS වැනි ඕස්ට්රේලියානු සංගිත කණ්ඩායම් සඳහා ද ලොව පුරා රසිකයින් ඇත.

ශ්රීමත් රොබර්ට් හෙල්ප්මාන්, මෙරිල් ටැන්කාර්, ස්ටීවන් පේජ් හා ලී කන්ෂින් වැනි ශ්රේෂ්ඨ නර්තන ශිල්පීන් සහ නර්තන නිර්මාණකරුවන්ගේ දැඩි උත්සාහයන් හේතුවෙන් ඕස්ට්රේලියානු නර්තනය වර්ධනය වී ඇත. බන්ගාරා ආදිවාසී නර්තන ආයතනයක් වන අතර, එහි වෙනස් වූ ආරකින් යුතු නර්තන, නාදරටාවන්, සංගීතය හා සැකැස්ම නිසාවෙන් ජාතිකව හා ලෝකය පුරා මහත් සේ පිළිගැනීමට ලක්ව ඇත.

විද්යාත්මක ජයග්රහණ සහ නව නිපැයුම්

ඕස්ට්රේලියානුවන්ට වෛද්ය විද්යාව, තාක්ෂණය, කෘෂිකර්මය,කැණීම් සහ නිමැවුම් සම්බන්ධ විද්යාත්මක ජයග්රහණ පිළිබඳ ශක්තිමත් වාර්තාවක් ඇත.

විද්යාත්මක සහ වෛද්ය විද්යාත්මක සොයාගැනීම් සඳහා ඕස්ට්රේලියානුවන් ගණනාවක් නොබෙල් ත්යාගයෙන් පිදුම් ලබා ඇත.

විද්යාත්මක සොයාගැනීම් සිදු කරන ලද පුද්ගලයින් වෙත වසරේ ඕස්ට්රේලියානුවා සම්මානයද හිමි වී ඇත. 2005 වර්ෂයේදී, පිළිස්සුම් තුවාල ලත් වින්දිතයින්ගේ සම මත ඉසිය හැකි දියරයක් නිපදවීම වෙනුවෙන් මහාචාර්ය ෆියෝනා වුඩ් වෙත මෙම සම්මානය පිරිනමන ලදී. 2006 වසරේදී මෙම සම්මානය ගැබ්ගෙල පිළිකාව සඳහා එන්නතක් වැඩිදියුණු කළ මහාචාර්ය ඉන් ෆ්රේසර් වෙත පිරිනමන ලදී. 2007 වසරේදී ප්රමුඛ පෙළේ පරිසර විද්යාඥයෙකු වන මහාචාර්ය ටිම් ෆ්ලැනරි වෙත මෙම සම්මානය හිමි විය.

මහාචාර්ය වුඩ් සහ මහාචාර්ය ෆ්රේසර් යන දෙදෙනාම බ්රිතාන්යයේ සිට ඕස්ට්රේලියාවට සංක්රමණය වූ අය වෙති. මහාචාර්ය ෆ්රේසර්ගේ සහාය නව නිපැයුම්කරු වූයේ මිය ගිය ආචාර්ය ජියැන් ෂූ ය. ඔහු චීනයේ සිට සංක්රමණය වී, ඕස්ට්රේලියානු පුරවැසියෙකු බවටද පත් වූයේය.

දොස්තර ෆියෝනා වුඩ් ඒඑම් (උපත 1958)

වෛද්ය වුඩ් ඕස්ට්රේලියාවේ වඩාත්ම නව්‍ය හා ගෞරවනීය ශල්ය වෛද්යවරුන්ගෙන් සහ පරේය්ෂකයන්ගෙන් කෙනෙකි. ඉතා දක්ෂ ප්ලාස්ටික් හා ප්රතිනිර්මාණය කිරීමේ ශල්ය වෛද්යවරියක් සහ ලොව පිළිස්සුම් විශේෂඥවරියක් වන ඇය පිළිස්සුම් වෛද්ය විද්යාවේ පරේය්ෂණ හා තාක්ෂණ සංවර්ධනය සඳහා පුරෝගාමී වූවාය.

2002 බාලි බෝම්බ ප්රහාරයට ගොදුරුවූවන් සමඟ ඇය කළ කටයුතුවලින් අනතුරුව, ආචාර්ය වුඩ් 2003 දී ඕස්ට්රේලියාවේ ඕඩර් ඔෆ් ඕස්ට්රේලියාවේ සාමාජිකාවක් ලෙස නම් කරන ලදී. පිළිස්සුම් සත්කාර සඳහා ඇයගේ දායකත්වය 2005 වසරේ ඕස්ට්රේලියානු සම්මානයෙන් පිදුම් ලැබීය.

මහාචාර්ය ෆ්රෙඩ් හොලෝස් (1929-1993)

මහාචාර්ය ෆ්රෙඩ් හොලෝස් උද්යෝගිමත් අක්ෂි වෛද්යවරයෙකු වූ අතර, ඕස්ට්රේලියාවේ හා සංවර්ධනය වන රටවල මිලියනයකට වැඩි පුද්ගලයින්ගේ ඇස් පෙනීම යථා තත්ත්වයට ගෙන ඒමට උපකාර වූයේය. ෆ්රෙඩ් හොලෝස් උපත ලැබුවේ නවසීලන්තයේය. 1965දී ඔහු ඕස්ට්රේලියාවට පැමිණි අතර, පසුව සිඩ්නිහි රෝහලක අක්ෂි අංශයේ ප්රධානියා බවට පත් විය.

ඔහු සියලුම මිනිසුන් සඳහා සමානාත්මතාව පිළිබඳව තරයේ විශ්වාස කළ අතර, පළමු ආදිවාසී වෛද්ය සේවාව ස්ථාපිත කිරීම සඳහා උපකාර කළේය. දැන් එයඕස්ට්රේලියාව පුරා ව්යාප්තව ඇත.

1980වන විට, ෆ්රෙඩ් හොලෝස් සංවර්ධනය වන රටවල අක්ෂි සෞඛ්ය වැඩසටහන් ස්ථාපිත කිරීමට ආධාර කිරීම සඳහා ලොව පුරා සංචාරය කරමින් සිටියේය. 1989 අප්රේල් මාසයේදී ඔහු ඕස්ට්රේලියානු පුරවැසියෙකු බවට පත් විය.

ඔහුගේ යහපත් කාර්යයන් ෆ්රෙඩ් හොලෝස් පදනම මගින් දිගටම පවත්වාගෙන යයි.

වසරේ ඕස්ට්‍රේලියානුවා සම්මානය

1960 වර්ෂයේ සිට ප්‍රමුඛ පෙළේ ඕස්ට්‍රේලියානුවන්ගේ ජයග්‍රහණ සහ දායකත්වයන් මෙම සම්මානය මගින් සැමරේ. ඕනෑම අයෙකුට මෙම සම්මානය සඳහා ඕනෑම ක්ෂේත්‍රයකින් යම් ඕස්ට්‍රේලියානුවෙකු නම් කළ හැකිය.

සිය කාර්යයන්හි විශිෂ්ටත්වයට පත්ව, ජාතියට සේවයක් කළ පුද්ගලයෝ වසරේ ඕස්ට්‍රේලියානුවෝ වෙති. වඩා යහපත් ඕස්ට්‍රේලියාවක් නිර්මාණය කිරීම සඳහා අපගේ දායකත්වයන් සැපයීමට ඔවුහු අපව දිරිමත් කර, අභියෝග කරති.

මෙම සම්මානවලට වසරේ තරුණ ඕස්ට්‍රේලියානුවා, ජ්‍යේෂ්ඨ ඕස්ට්‍රේලියානුවා සහ ඕස්ට්‍රේලියාවේ දේශීය වීරයා සම්මාන ඇතුළත් වේ.

වර්තමාන සහ අතීත සම්මානලාභීන්ගේ ලැයිස්තුවක් www.australianoftheyear.org.au වෙතින් ලබාගත හැකිය.

වෛද්‍ය ජේම්ස් මියුක් ඒඑම්

අක්ෂි ශල්‍ය වෛද්‍ය හා අන්ධභාවය වැළැක්වීමේ පුරෝගාමී 2020 වසරේ ඕස්ට්‍රේලියානුවා

වෛද්‍ය මියුක් "Sight For All" (සැමට පෙනීම) පුණ්‍යායතනයේ එක් කොටස්කරුවෙකු වන අතර, එහි අරමුණ වන්නේ, පරේයේෂණ, අධ්‍යාපනය, යටිතල පහසුකම් හා පාර්ශ්වකාර රටවල වෘත්තිකයින් පුහුණු කිරීම මගින් අන්ධභාවය මුලිනුපුටා දැමීමයි.

අන්ධභාවය මානව හිමිකම් ගැටලුවක් බව ඔහු විශ්වාස කරන අතර, සෑමදෙනෙකුටම දැකිය හැකි ලොවක් නිර්මාණය කිරීමට ඔහු කටයුතු කරයි.

මහාචාර්ය මිෂෙල් සිමන්ස් (උපත 1967)

ක්වොන්ටම් භෞතික විද්‍යාව පිළිබද මහාචාර්ය
2018 වර්ෂයේ වසරේ ඕස්ට්‍රේලියානු ජාතිකයා

මහාචාර්ය සිමන්ස් පරමාණුක දේශන හා ක්වොන්ටම් පරිගණකකරණයේ පුරෝගාමියෙකි. "පරිගණක යුගයේ අභ්‍යවකාශ ධාවන තරඟය" ලෙස ඇය හඳුන්වන ක්වොන්ටම් පරිගණකකරණයේ ප්‍රමුඛයා වන මහාචාර්ය සිමන්ස්, විසඳීමට වසර දහස් ගණනක් ගතවන ගැටළු මිනිත්තු කිහිපයකින් විසඳීමට හැකි ක්වොන්ටම් පරිගණකයක් තැනීම අරමුණු කරයි. එවැනි සොයා ගැනීමකට ඖෂධ සැලසුම් කිරීම, කාලගුණ අනාවැකි, ස්වයංක්‍රීයව ධාවනය වන වාහන, කෘතිම බුද්ධිය සහ තවත් බොහෝ දේ පිළිබද විප්ලවීය වෙනසක් කළ හැකිය.

ක්වොන්ටම් තොරතුරු විද්‍යාව සඳහා ඇය කළ කැපවීම සහ මෙහෙවර වෙනුවෙන් 2018 දී මහාචාර්ය සිමන්ස් වසරේ ඕස්ට්‍රේලියානු ජාතිකයා ලෙස නම් කරන ලදී. ක්වොන්ටම් හා පරමාණුක ඉලෙක්ට්‍රොනික ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා ලෙසත් ආදර්ශමත් චරිතයක් ලෙසත් ඇය විද්‍යා අධ්‍යාපනයට කළ විශිෂ්ට සේවය අගයමින් 2019 දී ඇය Officer of the Order of Australia ලෙස නම් කරන ලදී.

ඕස්ට්‍රේලියානු මුදල්

අපේ මුදල් මත ඇති පින්තූර මගින් ඕස්ට්‍රේලියාවට වැදගත් පුද්ගලයින් සහ සංකේත පෙන්නුම් කෙරේ.

අපේ මුදල් මත පෙන්නුම් කිරීමට තෝරාගෙන ඇති පුද්ගලයින් සමාජ ප්‍රතිසංස්කරණ, විද්‍යාව,දේශපාලන ය, හමුදා ජයග්‍රහණ සහ කලාවන් යන ක්ෂේත්‍රවල මූලිකත්ව ය හා දක්ෂතාව ය පෙන්වා ඇති පුද්ගලෙ යෝ වෙති.

II වන එළිසබෙත් රැජින (1926-2022)

II වන එළිසබෙත් රැජින ඕස්ට්‍රේලියාවේ රාාජ්‍ය නාායකයාාව සිටියාාය. ඇය ඕස්ට්‍රේලියාවේ සහ එක්සත් රාාජධාානියේ රැජිණව සිටියාාය. ඇයගේ දිගු සහ ජනප්‍රිය පාලන කාාලය තුල ඇය ශක්තිමත්ව සහ ස්ථාාවරව සිටියාාය.

පාර්ලිමේන්තු නිවස සහ ෆෝකෝට් මොසැයික

පාර්ලිමේන්තු නිවසේ ක්‍රමානුකූල සැලැස්ම, පාර්ලිමේන්තු නිවස ඉදිකිරීමේ අධිකාරි ය විසින් ලබා දෙන ලද සැලසුම් සංවර්ධන භූමිදර්ශන සැලැස්ම මත පදනම් වි ය.ෆෝකෝට් මොසැයික්, පොසම් හා වොලබි සිහින ය යන මැයෙන් මයිකල් නෙල්සන් ජගමාරා විසින් අඳින ලද මධ ය කාන්තාරික තිත් ශෛලියේ සිතුවම මත පදනම් වේ.

ඩේම් මාරි ගිල්මෝර් (1865-1962)

ඩේම් මාරි ගිල්මෝර්, ගත්කතුවරි යක්, මාධ යෙව්දිනි යක්, කිවිදි යක් හා සමාජ ප්‍රතිසංස්කරණ වෙනුවෙන් කටයුතු කළ ක්‍රියාකාරිනියක් විය. ඇයෙග් ලිවීම් හා කාන්තාවන්, දුප්පතුන් හා ආදිවාසීන් වෙනුවෙන් කථා කිරීම උදෙසා ඇ යව සිහිපත් කෙරේ.

ඒබී බැන්ජෝ පේටර්සන් (1869-1941)

ඇන්ඩෘ බාර්ටන් පේටර්සන් කවියෙක්, ගීත රචකෙ යක් හා මාධ්‍යවේදියෙක් වි ය. ඔහු බැන්ජෝ පේටර්සන් යන නමින් ලි යන ලද අතර, ඕස්ට්‍රේලියාවේ වඩාත්ම ජනප්‍රිය ජන ගී ය වන වෝල්ට්සින්ගේ මැටිල්ඩාහි ගී පද ලිවීම වෙනුවෙන් ඔහුව සුවිශේෂී ලෙස සිහිපත් කෙරේ.

පූජ්‍ය ජෝන් ෆ්ලින් (1880-1951)

පූජ්‍ය ජෝන් ෆ්ලින් ලෝකයේ ප්‍රථම ගුවන් වෛද්‍ය සේවාව වන ඕස්ට්‍රේලියානු රාජකී ය ගුවන් වෛද්‍ය සේවාව ආරම්භ කළේය. ඕස්ට්‍රේලියාවේ දුෂ්කර පෙදෙස්වලට සුව සේවාවන් ගෙනන යාම මගින් ජීවිත රැසක් බේරාගැනීම වෙනුවෙන් ඔහුව සිහිපත් කෙරේ.

මේරි රෙයිබේ (1777-1855)

මේරි රෙයිබේ නිව් සවුත් වේල්ස් ප්‍රාන්තයේ සිටි ප්‍රමුඛ පෙළේ ව්‍යාපාරික කාන්තාවකි. තරුණ රැඳවි පදිංචිකරුවෙකු ලෙස ඕස්ට්‍රේලියාවට පැමිණීමෙන් අනතුරුව ඇය ප්‍රජාවේ ගෞරවයට පාත්‍ර වූ නායිකාවක වූවාය.

එඩිත් කොවන් (1861-1932)

එඩිත් කොවන් සමාජ සේවිකාවක්, දේශපාලනඥයෙක් හා ස්ත්‍රීවාදී ක්‍රියාකාරිනියක විය. ඕනෑම ඕස්ට්‍රේලියානු පාර්ලිමේන්තුවකට තේරී පත්වූ පළමු කාන්තාව ඇයයි.

ඩේවිඩ් යුනෙයිපොන් (1872-1967)

ඩේවිඩ් යුනෙයිපොන් ලේඛකයෙකු, මහජන දේශකයෙකු හා නව නිපැයුම්කරුවෙකු විය. විද්‍යාව හා සාහිත්‍යය සඳහා සිය දායකත්වය වෙනුවෙන් හා ආදිවාසීන්ගේ තත්ත්වය වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් ඔහුව සිහිපත් කෙරේ.

ශ්‍රීමත් ජෝන් මොනෑෂ් (1865-1931)

ශ්‍රීමත් ජෝන් මොනෑෂ් ඉංජිනේරුවෙකු හා පරිපාලකයෙකු මෙන්ම ඕස්ට්‍රේලියාවේ ශ්‍රේෂ්ඨතම හමුදා සේනාධිනායකයින් අතරින් එක් අයෙකි. සිය නායකත්වය, බුද්ධිමත්භාවය හා චතුර කථිකත්වය වෙනුවෙන් සිහිපත් කෙරේ.

ඩාම් නෙලී මෙල්බා (1861-1931)

ඩාම් නෙලී මෙල්බා ලෝක ප්‍රසිද්ධ සොප්‍රානෝ ගායිකාවක් විය. ගීතයේ රැජිණ ලෙස ලොව පුරා ප්‍රචලිත වූ ඇය ජාත්‍යන්තර වශයෙන් ප්‍රසිද්ධියට පත් වූ ප්‍රථම ඕස්ට්‍රේලියානු ගායිකාවයි.

ජාතික දින හා සැමරුම්

ඕස්ට්‍රේලියානු ජාතික නිවාඩු දින මගින් යුරෝපා පදිංචිවීම් සිට අපගේ ඉතිහාසයේ සන්ධිස්ථාන මෙන්ම සැමරීම් ද නිරූපණ ය කෙරේ.

නිශ්චිත දින

- **ජනවාරි 1**වන දින නව අවුරුදු දිනය දා නව වර්ෂ ය සමරයි.
- **ජනවාරි 26 ඕ**ස්ට්‍රේලියානු දිනය යනු ඕස්ට්‍රේලියානුවෙකු වීම යන්නෙන් අදහස් කෙරෙන්නේ කුමක්ද යන්න ආවර්ජන ය කිරීමට හා වර්තමාන ඕස්ට්‍රේලියාව සැමරීමට සහ අපගේ සාමූහික ඉතිහාස ය හඳුනාගැනීමට කාල යක් වේ. 1788දී සිඩ්නි කෝව් වෙත පළමු බලඇණිය පැමිණීම මෙදින සමරයි.
- **අප්‍රේල් 25 දින** ඇන්සැක් දිනය මගින් පළමු ලෝක යුධ සමයේදී ඕස්ට්‍රේලියානු හා නවසීලන්ත හමුදාවන් ගැලිපොලි වෙත ගොඩබැසීමේ සංවත්සර ය සමරයි.මෙය ඉතා සංවේදී දින යක් වන්නේ, යුද්ධවලදී, ගැටුම්වලදී හා සාමසාධක මෙහෙයුම්වලදී සේවය කර, මි ය ගි ය සි යලුම ඕස්ට්‍රේලියානුවන්ගේ පරිත්‍යාගය අප සිහිපත් කරන දින හෙයිනි. අපි සි යලුම හමුදා සෙබළුන්ගේ සහ කාන්තා සොල්දාදුවන්ගේ ධෛර්යය හා කැපවීමට ගරු කරන අතර, යුද්ධයේ විවිධ අර්ථ පිළිබඳව ආවර්ජන ය කරමු.
- **දෙසැම්බර් 25** දින නත්තල් ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ උපත සමරන ක්‍රිස්ති යානි සැමරීම මත පදනම් වූ තෑගි ලබාදෙන දින යයි.
- **දෙසැම්බර් 26** බොක්සින් දිනය නත්තල් සැමරුමෙහි කොටසකි.

වෙනස් වන දින

- **කම්කරු දිනය හෝ පැය අටේ** දිනය ලෝකයේ පළමු වරට ඕස්ට්‍රේලියානු වැඩ කරන ජනතාව පැය අටේ වැඩ කිරීම ලබාගැනීම සමරයි.
- **පාස්කු දිනය දා** ජේසුස් වහන්සේගේ ස්වර්ගස්ථ වීම හා උත්ථාන වීම සමරයි.
- **ඕස්ට්‍රේලියාවේ රාජ්‍ය** නා යක යා වන III වන චාර්ල්ස් රජතුමාගේ උපත රජතුමාගේ උපන් දිනය මගින් සමරයි. මෙම සැමරීම බටහිර ඕස්ට්රේලියාවේ හා ක්වීන්ස්ලන්ත ය හැර අන් සි යලුම ප්රාන්තවල හා ටෙරිටරිවල ජුනි මාසෙය් දෙවන සඳුදා පැවැත්වේ.

වෙනත් රජයේ නිවාඩු

වෙනස් ප්‍රාන්තවල,ටෙරිටරිවල හා මහා නගරවල වෙනත් රජෙය් නිවාඩු ක්‍රියාත්මක වේ. නිදසුනක් ලෙස, ඕස්ට්‍රේලියානු කැපිටල් ටෙරිටරියේ කැන්බරා දිනය, දකුණු ඕස්ට්‍රේලියාවේ ස්වේච්ඡා සේවකයින්ගේ දින ය හා බටහිර ඕස්ට්‍රේලියාවේ පදනම් දින ය ක්රි යාත්මක වේ.

වෙනත් වැදගත් දිනයන් (රජයේ නිවාඩු නොවන)

- **සංහිඳියා සතිය** මාර්තු 21 ඇතුළත් සතියේ පැවැත්වෙන අතර, එ ය අපගේ සංස්කෘතික විවිධත්වය සැමරීමකි.
- **සැප්තැම්බර් 17** දින ඕස්ට්‍රේලියානු පුරවැසි දිනය පුරවැසිභාව ය නියෝජනය කරන පොදු බැඳීම සමරන හා අපගේ රටේ අනාගතය හැඩගැස්වීමේදී අපගේ භූමිකාව ආවර්ජන ය කරන දින යකි.
- **මැයි 27 සිට ජුනි 3** දක්වා ජාතික සංහිඳියා දින ය එක්සත්බව හා අන්‍යෝන්‍ය ගරුත්වය ජයග්‍රහණය කරවමින් වඩාත් සාධාරණ, සමාන ජාතියක් ඇති කිරීමට ප්‍ර යත්න දරන සති යකි.

ඕස්ට්‍රේලියානු ජනතාව

ලෝකයේ විවිධත්වයෙන් වැඩිම සමාජවලින් එකකි, ඕස්ට්‍රේලියාව. ජනගහනයෙන් ආසන්න වශෙ යන් සි ය යට තුනක් ආදිවාසීන් ලෙස හඳුනාගැනේ. ඕස්ට්‍රේලියාවේ පදිංචිකරුවන්ගෙන් තුනෙන් එකකට වඩා විදේශ රටවල උපන් අ ය වූ අතර, රටවල් 200කට වැඩි ප්‍රමාණ යකින් සංක්‍රමණ ය වී ඇත. ජනගහනයේ විවිධත්ව ය ඕස්ට්‍රේලියාවට භාෂාවල, විශ්වාසයන්හි, සම්ප්‍රදායන්හි සහ සංස්කෘතිවල පරිපූර්ණ විවිධත්වයක් ලබා දේ.

පොදුරාජ්‍ය මණ්ඩලීය ජාතීන්ගේ සාමාජිකයෙකු වශයෙන් ඕස්ට්‍රේලියාවට තවමත් එක්සත් රාජධානිය සමඟ සමීප සම්බන්ධතා ඇත.

ඕස්ට්‍රේලියානු ජනතාව පුරවැසිභාවය පිළිබඳ ආඩම්බර වන්නේ, එය අපගේ විවිධත්වයෙන් යුතු සමාජයේ එකට බැඳ තබන වැදගත් බැඳීමක් වන හෙයිනි. සෑම වර්ෂයකම සැප්තැම්බර් 17වන දින ඕස්ට්‍රේලියානු පුරවැසි දින ය සැමරේ. අපගේ ජාතිය ගොඩනැංවීමේදී හා රටේ අනාගතය හැඩගැස්වීමේදී අපගේ භූමිකාව පිළිබඳ ආවර්ජනය කිරීම සඳහා සියලුම ඕස්ට්‍රේලියානු පුරවැසියන්ට ලැබෙන දිනයකි.

ඕස්ට්‍රේලියාවේ ආර්ථිකය

ඕස්ට්‍රේලියාවට ස්ථාවර හා තරඟකාරී ආර්ථිකයක් ඇති අතර, එහි විවිධත්වයෙන් යුතු නිපුණතා සහිත ශ්‍රම බලකාය අගය කෙරේ. ඕස්ට්‍රේලියාවේ ජනතාව අත්විඳින ගුණාත්මක ජීවන රටාව ලෝකයේ ඉහළම පෙළේ ජීවන රටාවන්ගෙන් එකකි.

ඩික් ස්මිත් (1944දී උපත ලදී)

ඩික් ස්මිත් ඕස්ට්‍රේලියානු ව්‍යාපාරිකයෙකු, ගවේෂකයෙකු හා මානුෂවාදියෙකු වේ. ඔහු විද්‍යුත් උපකරණ ව්‍යාපාරයෙන් සිය වාසනාව ළඟාකරගත් අතර, ඕස්ට්‍රේලියාවේ අභිවෘද්ධිය උදෙසා සිය ධනය වැය කළේය. ඔහු ඕස්ට්‍රේලියානු ආහාර සමාගමක් ආරම්භ කළ අතර, සමාගම ඕස්ට්‍රේලියාව සතුව තබාගැනීමට ඩොලර් මිලියන ගණන් ආයෝජය කර ඇත.

1986දී ඔහුව වසරේ ඕස්ට්‍රේලියානුවා ලෙස නම් කරන ලද අතර, තාක්ෂණික වැඩිදියුණුකිරීම් හා පාරිසරික සංරක්ෂණය සඳහා සම්මානයක් දිනාගන්නා ලදී. උණුසුම් වායු බැලූනයක නැගී ඕස්ට්‍රේලියාව සහ ටැස්මන් මුහුද තරණය කළ පළමු පුද්ගලයා වූයේ ඔහුය. ගවේෂණයට ඇති ඇල්ම, ව්‍යාපාරවල සාර්ථකත්වය හා ඔහුගේ දේශප්‍රේමීත්වය වෙනුවෙන් ඔහු ප්‍රසිද්ධියට පත්ව ඇත.

වෙළඳපොළ

ඕස්ට්‍රේලියාවේ නූතන ස්ථාවර මූල්‍ය ආයතන සහ බදු හා වෙළඳ රෙගුලාසි මගින් ව්‍යාපාර ක්‍රියාකාරකම්වලට නිශ්චිත බවක් ලබා දේ. සංචාරක, අධ්‍යාපන හා මූල්‍ය සේවාවන් ඇතුළු සේවා කර්මාන්ත මගින් ඕස්ට්‍රේලියාවේ ශුද්ධ දේශීය නිෂ්පාදිතය තුළ සුවිශේෂී අගයක් ජනනය කරයි.

ඕස්ට්‍රේලියාවේ ආර්ථික ස්ථායිතාව ආයෝජන සඳහා යහපත් පසුබිමක් සලසයි. ඕස්ට්‍රේලියාවේ කොටස් වෙළඳපොළ ආසියා පැසිෆික් කලාපයේ ඇති විශාලතම කොටස් වෙළඳපොළවලින් එකකි.

වෙළඳාම

ඕස්ට්‍රේලියාවේ විශාලතම වෙළඳ පාර්ශ්වකරුවන් වන්නේ, චීනය, ජපානය, එක්සත් ජනපදය, දකුණු කොරියාව, සිංගප්පූරුව, ඉන්දියාව, නවසීලන්තය හා එක්සත් රාජධානියයි. මෙරට ප්‍රධාන අපනයන භාණ්ඩ වන්නේ අඟුරු, යපස්, ස්වාභාවික වායු සහ අධ්‍යාපන හා සංචාරක සේවාවන්ය. ආර්ථිකය විවෘත අතර, ඕස්ට්‍රේලියාවේ ආර්ථිකසෞභාග්‍යය කෙරෙහි වෙළඳාම වැදගත් දායකත්වයක් දක්වයි.

පතල් කැණීම්

ඕස්ට්‍රේලියාව අඟුරු, තඹ, ද්‍රවීකෘත ස්වාභාවික වායු හා ඛනිජ වැලි වැනි ස්වාභාවික සම්පත්වලින් පොහොසත්ය. ඒවාට ලෝකය පුරා ඉහළ ඉල්ලුමක් ඇත.

ගෝලීය පුරවැසියෙකු ලෙස ඕස්ට්‍රේලියාව

ගෝලීය පුරවැසියෙකු ලෙස සිය භූමිකාව පිළිබඳ ඕස්ට්‍රේලියාව ආඩම්බර වේ. ලෝකය පුරා අඩු අවස්ථාවන් සහිත කොටස්වලට උදව් කිරීම මගින් ඕස්ට්‍රේලියාව මෙය පෙන්නුම් කරයි.

ජාත්‍යන්තර ආධාර සහ මානුෂීය ප්‍රයත්නයන්

ඕස්ට්‍රේලියානු රජයේ ජාත්‍යන්තර ආධාර වැඩසටහන මගින් දරිද්‍රතාව අවම කර, තිරසර සංවර්ධනය ළඟාකරගැනීම සඳහා සංවර්ධනය වන රටවලට සහාය ලබා දේ. පුද්ගලයින් හා රජයන් වෙත සහාය ලබාදීම මගින් කලාපය තුළ හා ලෝකය පුරා මෙම සහාය ලබාදේ.

අප රටේ හෝ විදේශ රටවල ආපදා ඇති වූ විටදී, ඕස්ට්‍රේලියානුවෝ දැඩි ත්‍යාගශීලී බවක් පෙන්නුම් කරති. අපි නිරන්තරයෙන් පෞද්ගලික ප්‍රදාන හා ඕස්ට්‍රේලියානු ආධාර වැඩසටහන මගින් දුෂ්කරතාවලට මුහුණදෙන රටවලට ද ආධාර කරමු.

2018දී, තායිලන්තයේ ගංවතුරින් පිරි ගුහාවක සිරවුණු කුඩා ළමුන් 12දෙනෙකු හා ඔවුන්ගේ සොකර් පුහුණුකරු බේරාගැනීමට දරන ලද ප්‍රයත්නය වෙනුවෙන් වෛද්‍ය රිචර්ඩ් හැරිස් හා වෛද්‍ය ක්‍රේග් චැලන් වෙත දෙවන ඉහළම නිර්භීත පදක්කම, ධෛර්යයේ පදක්කම හා මෙඩ්ල් ඔෆ් ඕස්ට්‍රේලියා සමඟම පිරිනමන ලදී.

ජාත්‍යන්තර සංසදවලදී සක්‍රීය ක්‍රියාකාරිත්වය

ඕස්ට්‍රේලියාව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරම්භයේ සිට එනම් 1945 සිට ක්‍රියාකාරී සාමාජිකයෙකුව සිටියි. ඕස්ට්‍රේලියාව, 1951 එක්සත් ජාතීන්ගේ සරණාගත සම්මුතිය යටතේ සරණාගතයින් ලෙස හඳුනාගනු ලබන පුද්ගලයින් වෙත ආරක්ෂාව ලබා දෙයි. එමගින් එක්සත් ජාතීන්ගේ සාමසාධක ප්‍රයත්නයන් සහ සංවර්ධනය වන රටවල් සඳහා මානුෂීය හා හදිසි ප්‍රතිචාර වෙනුවෙන්ද දායකත්වය ලබා දෙන අතර, එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානය සමඟ ශක්තිමත් බැඳීමක් ඇත.

1971දී, ඕස්ට්‍රේලියාව ආර්ථික සහයෝගිතාව සහ සංවර්ධනය සඳහා වන සංවිධානයෙහි පූර්ණ සාමාජිකයෙකු බවට පත් විය. එම සංවිධානයේ අරමුණ වන්නේ,ලෝක වෙළඳාම පුළුල් කරමින්, ලොව පුරා ජනතාවගේ ආර්ථික සහ සමාජ මට්ටම වැඩිදියුණු කිරීමයි.

ඕස්ට්‍රේලියාව ආසියා - පැසිෆික් කලාපය තුළ සමීප සහයෝගිතාව වෙනුවෙන් උපරිම සහාය දක්වයි. එය, ආසියා-පැසිෆික් ආර්ථික සහයෝගිතාවයේ, නැගෙනහිර ආසියා සමුළුවේ හා පැසිෆික් දූපත් සංසදයේ ක්‍රියාකාරී සාමාජිකයෙකි. එය, ගිණිකොණදිග ආසියානු සංවාද පාර්ශ්වකරුවන්ගේ සංවිධානයක් වන අතර, එහි කලාපීය සංසදයට සහභාගී වෙයි.

වෛද්‍ය කැතරින් හෙම්ලින් ඒසී (උපත 1924-2020)

වෛද්‍ය කැතරින් හෙම්ලින් ප්‍රසව හා නාරිවේද වෛද්‍යවරියක් වන අතර, තරුණ ඉතියෝපියානු කාන්තාවන් දුක්ඛිත ජීවිතයකින් ගලවා ගැනීම සම්බන්ධයෙන් ඇය ප්‍රසිද්ධියට පත් වූවාය. 1959 සිට ඇය ඉතියෝපියාවේ අඩිස් අබාබාහි සේවය කරන ලද අතර, ඔබ්ස්ටෙට්‍රික් ෆිස්ටුලා යන නමින් හැඳින්වෙන දරු උපතකදී සිදුවන තුවාලයක් සම්බන්ධයෙන් කාන්තාවන්ට උපකාර කළාය. මෙම අභ්‍යන්තර තුවාලය සහිත කාන්තාවන්ට සිය ශාරීරික ක්‍රියාකාරකම් පාලනය කළ නොහැකි අතර, ඔවුන්ව උපහාසයට ලක්වන අතර, ප්‍රජාව තුළ කොන්වීමට ලක් වේ.

ඇය සහ ඇගේ සැමියා අඩිස් අබාබා ෆිස්ටුලා රෝහල ස්ථාපනය කළහ. ඔවුන්ගේ උත්සාහයන් මගින් කාන්තාවන් දහස් දෙනෙකුට පූර්ණ සෞඛ්‍යමත් ජීවිතයක් ගත කිරීම සඳහා නැවත සිය නිවසට යා හැකි විය.

1995දී, ඕස්ට්‍රේලියාවේ ඉහළම සම්මානය වන ඕඩර් ඔෆ් ඕස්ට්‍රේලියාහි පාර්ශ්වකරුවෙකු බවට වෛද්‍ය හැමිලින් පත් කරනු ලැබීය.

ඕස්ට්‍රේලියානු නොබෙල් ත්‍යාගලාභීන්

ඕස්ට්‍රේලියාව විද්‍යාත්මක හා වෛද්‍ය විද්‍යාත්මක පරේයේෂණ සඳහා ප්‍රසිද්ධියක් උසුලයි. පහත සඳහන් ඕස්ට්‍රේලියානුවන් මෙම ක්ෂේත්‍රයන්හි නොබෙල් ත්‍යාගයක් දිනා ඇත.

- **මහාචාර්ය විලියම් බ්‍රැග්** (1862-1942) හා **ලෝරන්ස් බ්‍රැග්** (1890-1971), **භෞතිකවේදීන්**
  විලියම් බ්‍රැග්(පියා) සහ ලෝරන්ස් බ්‍රැග් (පුතා) 1915දී භෞතික විද්‍යාව සඳහා 1915දී ඒකාබද්ධ ජයග්‍රාහකයන් වූයේ,එක්ස් රේ කිරණ මගින් පළිඟු සැකැස්ම විශ්ලේෂණය කිරීම සඳහා සිදු කරන ලද සේවය වෙනුවෙනි.
- **ශ්‍රීමත් හොවාර්ඩ් වෝල්ටර් ෆ්ලෝරි** (1898-1968), **ව්‍යාධිවේදී,**
  දකුණු ඕස්ට්‍රේලියාවේ ඇඩිලේඩ්හි උපත ලද අතර, 1945දී ව්‍යාධිවේදය හෝ වෛද්‍ය විද්‍යාව (එක්ව) සඳහා නොබෙල් ත්‍යාගය ලද්දේ, පෙනිසිලින් සහ විවිධ බෝවන රෝග සඳහා එහි සුවය සැලසීමේ හැකියාව සොයාගැනීම වෙනුවෙනි.
- **ශ්‍රීමත් මැක්ෆාර්ලේන් බර්නෙට්** (1899-1985), **වෛද්‍ය විද්‍යාඥ හා ජීවවිද්‍යාඥ,**
  වික්ටෝරියාහි උපත ලද අතර, 1960දී ව්‍යාධිවේදය හෝ වෛද්‍ය විද්‍යාව (එක්ව) සඳහා නොබෙල් ත්‍යාගය ලද්දේ, discovery of acquired immunological tolerance වෙනුවෙනි.
- **ශ්‍රීමත් ජෝන් කැරූ එක්ලෙස්** (1903-97), **ව්‍යාධිවේදී,**
  මෙල්බර්න්හි උපත ලද අතර, 1963දී ව්‍යාධිවේදය හෝ වෛද්‍ය විද්‍යාව (එක්ව) සඳහා නොබෙල් ත්‍යාගය ලද්දේ, discoveries concerning the ionic mechanisms involved in excitation and inhibition in the peripheral and central portions of the nerve cell membrane වෙනුවෙනි.
- **ශ්‍රීමත් බර්නාර්ඩ් කැට්ස්** (1911-2003), **කායික රෝග විශේෂඥ හා ජෛවභෞතිකවේදී,**
  ජර්මනියේ උපත ලද අතර, 1941දී ඕස්ට්‍රේලියානු පුරවැසියෙකු බවට පත් විය. ඔහුට ව්‍යාධිවේදය හෝ වෛද්‍ය විද්‍යාව සඳහා 1970දී නොබෙල් ත්‍යාගය හිමි වූයේ, discoveries concerning the humoral transmitters in the nerve terminals and the mechanism for their storage, release and inactivation වෙනුවෙනි.
- **මහාචාර්ය ජෝන් වෝර්කප් කෝන්ෆෝර්ත්** (1917-2007),
  රසායන විද්‍යාඥ, ඔහු සිඩ්නිහි උපත ලැබූ අතර, 1975දී රසායන විද්‍යාව සඳහා (එක්ව) නොබෙල් ත්‍යාගය හිමිකරගන්නා ලද්දේ his work on the stereochemistry of enzyme-catalysed reactions වෙනුවෙනි.
- **මහාචාර්ය පීටර් ඩූහර්ටි** (උපත 1940),
  ප්‍රතිශක්තිකරණවේදී, ඔහු ක්වීන්ස්ලන්ඩ්හි උපත ලැබූ අතර, 1996දී ව්‍යාධිවේදය හා වෛද්‍ය විද්‍යාව සඳහා (එක්ව) නොබෙල් ත්‍යාගය හිමිකරගන්නා ලද්දේ discoveries concerning the specificity of the cell mediated immune defence වෙනුවෙනි.
- **මහාචාර්ය බැරි මාර්ෂල්** (උපත 1951), **ආන්ත්‍රික විශේෂඥ, හා වෛද්‍ය රොබින් වොරන්** (උපත 1937), **ව්‍යාධිවේදී,**
  2005දී ව්‍යාධිවේදය හෝ වෛද්‍ය විද්‍යාව සඳහා (එක්ව) ඔවුන් නොබෙල් ත්‍යාගය හිමිකරගන්නා ලද්දේ discovery of 'the bacterium Helicobacter pylori and its role in gastritis and peptic ulcer diseaseවෙනුවෙනි.
- **මහාචාර්ය එළිසබෙත් හෙලන් බ්ලැක්බර්න්** (උපත 1948), **ජීවවිද්‍යාඥ,**
  හෝබාර්ට්හිදී ඇය උපත ලද අතර, 2009දී ව්‍යාධිවේදය හෝ වෛද්‍ය විද්‍යාව සඳහා (එක්ව) නොබෙල්ත්‍යාගය හිමිකරගන්නා ලද්දේ the discovery of how chromosomes are protected by telomeres and the enzyme telomerase වෙනුවෙනි.
- **මහාචාර්ය බ්‍රයන් පී.ශ්මිඩ්ට්** (උපත 1967), **ගගනගාමී,**
  2011දී භෞතික විද්‍යාව සඳහා (එක්ව) නොබෙල් ත්‍යාගය හිමිකරගන්නා ලද්දේ the discovery of the accelerating expansion of the universe through observations of distant supernovaeවෙනුවෙනි.

පහත සඳහන් ඕස්ට්‍රේලියානුවා සාහිත්‍යය සඳහා නොබෙල් ත්‍යාගය හිමිකරගෙන ඇත.

- **පැට්රික් වයිට්** (1912-90), **නවකථාකරු හා නාට්‍ය පිටපත් රචක,**
  ඕස්ට්‍රේලියානු දෙමව්පියන්ට දාව ලන්ඩනයේදී උපත ලද අතර, ඔහුට සාහිත්‍යය සඳහා 1973දී නොබෙල් ත්‍යාගය හිමිවූයේ an epic and psychological narrative art which has introduced a new continent into literature වෙනුවෙනි.

සයවන කොටස

අපගේ ඕස්ට්‍රේලියානු වෘත්තාන්තය

අපගේ ඕස්ට්‍රේලියානු වෘත්තාන්තය

ඕස්ට්‍රේලියාවේ වෘත්තාන්තය විවිධ පුද්ගලයින්ගෙන් හා සිදුවීම්වලින් හැඩගැසී ඇත.

ආදිවාසී ඕස්ට්‍රේලියානුවන් (Aboriginal and Torres Strait Islander peoples)

ඕස්ට්‍රේලියාවේ මුල්වැසියන් වන්නේ ඇබොරිජිනල් හා ටොරස් ස්ට්‍රේට් දූපත්වාසීන්ය. දැනට ලෝකයේ පවතින පැරණිතම සංස්කෘතීන් හා සම්ප්‍රදායයන් ඔවුන් සතු වේ.

පුරාවිද්‍යා වාර්තාවල දැක්වෙන්නේ ආදිවාසී ජනයා මීට වසර 65,000 ත් 40,000 ත් අතර කාලයකට පෙර ඕස්ට්‍රේලියාවට පැමිණි බවයි; කෙසේ වෙතත්, ආදිවාසී ජනයා විශ්වාස කරන්නේ මෙම භූමියේ මැවීමේ කථා වල කේන්ද්‍රීය ඒවා වන අතර ඔවුන්ගේ නිර්මාණ කථා ආරම්භ වන්නේ කාලයාගේ ඇවෑමෙන් බවයි.

ආදිවාසීන් සතුව අදටද ඔවුන් වෙත මගපෙන්වනු ලබන අතිශයින් පැරණි විශ්වාස සහ සම්ප්‍රදායයන් පවතී. ඔවුන්ට භූමිය සමඟ ගැඹුරු සම්බන්ධතාවක් පවතින අතර, සිය වෘත්තාන්ත, කලාව හා නර්තනය මගින් ප්‍රකාශ කෙරේ.

භාෂා

බ්‍රිතාන්‍ය පදිංචිකිරීම්වලට පෙර,ආදිවාසීන් විසින් ඕස්ට්‍රේලියාවේ 700කට වඩා භාෂා සහ ප්‍රභේද භාවිත කරන ලදී. භාෂා විස්සකට වඩා අඩුවෙන් දරුවන්ට ලබා දුන්නද, මෙම භාෂාවලින් 100කට වැඩි ප්‍රමාණයක් අදටත් භාවිත කෙරේ. ආදිවාසී සංස්කෘතින් තුළ ඇති වාචික ඉතිහාසයන් අතිශයින් වැදගත් වන්නේ, එමගින් ජනතාවගේ හා භූමියේ කථාව හෙළිකරන නිසාවෙනි.

ඩ්‍රීමින් (Dreaming)

ඇබොරිජිනල් ජනතාවගේ ජීවිතයට මගපෙන්වන දැනුමේ, විශ්වාසයේ හා පුහුණුවේ ක්‍රමය විස්තර කිරීමට නිතර යොදාගන්නා බටහිර යෙදුමකි, ඩ්‍රීමින්.

දෙමව්පියෝ හා වැඩිහිටියෝ දරුවන්ට ඩ්‍රීමින් වෘත්තාන්ත කියා දෙති. මෙම වෘත්තාන්ත මගින් ඔවුන්ගේ භූමිය හැඩගැසුණේ සහ ජනාවාස වූයේ කෙසේද යන්න පිළිබඳව උගන්වනු ලැබේ. මෙම වෘත්තාන්ත මගින් කැළෑව තුළ ආහාර සොයාගන්නේ කවර ස්ථානවලින්ද වැනි වටිනා ප්‍රායෝගික පාඩම් කියාදෙනු ලැබේ.

ඩ්‍රීමින් වෘත්තාන්ත සංගීතය, ගීත හා නර්තනය යොදාගනිමින් කියාදෙනු ලැබේ. ආදිවාසීන් ගී ගයා නටන විට, ඔවුන්ට සිය මුතුන්මිත්තන් සමඟ ඉතා ගැඹුරු සම්බන්ධතාවක් දැනේ.

ආදිවාසී කලාවන්හි මුල් ස්වරූපයන් වූයේ ශෛල කැටයම් හෝ සිතුවම් සහ භූමි සැකසුම්ය. මධ්‍යම ඕස්ට්‍රේලියාවේ ජනයා සාමාන්‍යයෙන් තිත්, රවුම් සහ නිශ්චිත සංස්කෘතික සංකේත භාවිතා කරමින් ස්වප්නගත භූමි හෝ කථා නිරූපණය කළහ, ඕස්ට්‍රේලියාවේ උතුරු ප්‍රදේශවල මිනිසුන්, සතුන්, සංකේත සහ ආත්මයන්ගේ රූප පින්තාරු කළහ.

අදටත්, ඇබොරිජිනල් ජනතාවට මේ සිහින වැදගත්ය.

කකඩු ආදිවාසී චිත්‍ර

ඕස්ට්‍රේලියාවේ පළමු යුරෝපීයන්

මුල්කාලීන යුරෝපා ගවේෂණය

17වන සියවසේදී, යුරෝපා ගවේෂකයෝ - ටෙරා ඔස්ට්‍රාලිස් ඉන්කොග්නිටා - දකුණු දෙස හඳුනානොගත් භූමිය යනුවෙන් ඔවුන් හඳුන්වන කොටස් සොයාගත්හ. 1606දී, ලන්දේසි ජාතික විලෙම් ජාන්සූන් ඕස්ට්‍රේලියාවේ උතුරු තුඩුවේ කේප් යෝර්ක් අර්ධද්වීපයේ බටහිර කොටස සිතියම්ගත කළේය. මෙම කාලය වන විට, ලුයිස් වාස් ඩි ටොරස් විසින් නායකත්වය දෙන ලද ස්පාඤ්ඤ නැවක් සමුද්‍ර සන්ධිය හරහා ඕස්ට්‍රේලියාවේ උතුරට යාත්‍රා කළේය.

පසුව, 1600දී, ලන්දේසි නැවියෝ බටහිර ඕස්ට්‍රේලියානු වෙරළ තීරය ගවේෂණය කරන ලද අතර, මෙම භූමිය නව ඕලන්දය ලෙස නම් කළහ.



අබෙල් ටැස්මන්ගේ නව ඕලන්ද සිතියම, 1644

1642දී, අබෙල් ටැස්මාන් නව භූමියක වෙරළ තීරයක් සොයාගන්නා ලද අතර, ඔහු එය වැන් ඩීමන්ගේ භූමිය (දැන් තස්මේනියාව) ලෙස නම් කරන ලදී. ඔහු ඕස්ට්‍රේලියානු වෙරළේ සැතපුම් දහස් ගණනක් සිතියම්ගත කළේය. ඔහුගේ අසම්පූර්ණ නිව් හොලන්ඩ් සිතියම මගින් දැක්වෙන්නේ එම භූමිය උතුරින් පැපුවා නිව් ගිනියාවට සම්බන්ධව තිබූ බව ඔහු විශ්වාස කළ බවයි.

ඕස්ට්‍රේලියානු භූමියට පය තැබූ පළමු ඉංග්‍රීසි ජාතිකයා වූයේ විලියම් ඩැම්පියර්ය. 1684දී, ඔහු වයඹ දිග වෙරළ තීරයට සේන්දු විය. එම භූමිය කෙතරම් වියළි හෝ දූවිල්ලෙන් පිරි එකක්ද තියතොත්, ඔහු එය වෙළඳාම හෝ පදිංචිකරවීම සඳහා සුදුසු යැයි සැලකුවේ නැත.

කපිතාන් ජේම්ස් කුක්

1770දී ඉංග්‍රීසි ජාතික ජේම්ස් කුක් ඕස්ට්‍රේලියාවේ නැගෙනහිර වෙරළ තීරයට ළඟාවනතෙක්, යුරෝපා ජාතිකයින් විසින් එය ගවේෂණය කර නොතිබිණි. බ්‍රිතාන්‍ය රජය විසින් ඔහුව දකුණු පැසිෆික්හි ගවේෂණ චාරිකාවක් සඳහා එවන ලදී. ඔහු නැගෙනහිර වෙරළ තීරය සිතියම්ගත කර, නූතන සිඩ්නිහි දකුණට වන්නට ඇති බොටනි බේහි එන්ඩේවර්හි සිය නැව නැංගුරම් ලෑවේය. ජේම්ස් කුක් මෙම භූමිය නිව් සවුත් වේල්ස් යන නමින් හඳුන්වන ලද අතර, එය 3වන ජෝර්ජ් රජු නමින් කැප කරන ලදී.

රැඳවියන් ප්‍රවාහනය කිරීම

ඕස්ට්‍රේලියාව අද්විතීය වන අතර, එහි පළමු යුරෝපා පදිංචිකරුවන් වූයේ රැඳවියන්ය. ඇමෙරිකා එක්සත් ජනපදය නිදහස ලබාගැනීමෙන් පසුව, මහා බ්‍රිතාන්‍යයට එහි රැඳවියන් එහි යැවීමට නොහැකි වූ අතර, බ්‍රිතාන්‍ය සිරගෙවල් පිරී ඉතිරී ගියේය. 1786දී, මහා බ්‍රිතාන්‍යය රැඳවියන් කොටසක් නිව් සවුත් වේල්ස් යටත්විජිතයට ප්‍රවාහනය කිරීමට තීරණය කළේය.

පළමු යටත්විජිතය

නිව් සවුත් වේල්සයේ පළමු ආණ්ඩුකාරවරයා වූයේ කපිතාන් ආතර් පිලිප්ය. 1788 ජනවාරි 26දින සිඩ්නි කෝව් වෙත පළමු බලඇණියත් සමඟ ඔහු බ්‍රිතාන්‍යයේ සිට ලෝකයේ අනෙක් පසට නැව් 11ක් ආරක්ෂිතව ගෙන ආවේය. අපි සෑම වර්ෂයකම මෙම දිනය ඕස්ට්‍රේලියානු දින සංවත්සරය ලෙස සමරමු.

1788දී බ්‍රිතාන්‍යයෙන් පිටත් වූ පළමු බල ඇණිය සිඩ්නි කෝව් වෙත ළඟාවීම

යටත්විජිත පදිංචිකිරීම්හි මුල් වර්ෂ

යටත්විජිත පදිංචිකිරීම්හි මුල් වර්ෂ ඉතාමත් දුෂ්කර විය. මිනිසුන් නිරාහාරව නොසිටින බව තහවුරු කරගැනීම සඳහා, ආණ්ඩුකාර පිලිප් තමා මෙන්ම තමාගේ නිලධාරීන්ද ඇතුළුව සියලුමදෙනා එකම සලාකයකට ඇතුළත් කළේය. එම මුල් දුෂ්කර වර්ෂවල යටත්විජිතය රැකගැනීමට ඔහුගේ සාමාන්‍ය දැනීම සහ අධිෂ්ඨානය උපකාරී විය.

රැඳවියෝ මුල් පදිංචිකිරීම්හි වෙහෙස වී වැඩ කළහ. සිය දඬුවම් කාලය අවසන් කරන ලද පුරුෂයින් හා කාන්තාවන්ට නිදහස හිමි වූ අතර, වැඩ කර, පවුල් නඩත්තු කිරීම සඳහා සමාජයට ප්‍රවේශ විය.

නව අවස්ථා

ඕස්ට්‍රේලියාවේ මුල් යුරෝපා ජනගහනය විශාල වශයෙන් ඉංග්‍රීසි, ස්කොට්, වේල්ස් සහ අයිරිෂ් ජනතාවගෙන් සමන්විත විය. ස්කොට්, වේල්ස් සහ අයිරිෂ් ජාතිකයින් සෑමවිටම ඉංග්‍රීසි ජාතිකයින් සමඟ යුධ වැදුණු නමුත්, මෙම කණ්ඩායම් හතර ඕස්ට්‍රේලියාවේ එක්ව ජීවත් වී, වැඩ කළෝය.

රැඳවියන් හා මුල් රැඳවියන් විසින් යටත්විජිතයේ නව අවස්ථා සොයා යාම ආරම්භ කරන ලදී. ඇතැම් රැඳවියෝ වෙළෙන්දන් ලෙස ඔවුන්ගේම ව්‍යාපාර ආරම්භ කළහ. ගොවියන්, වෙළෙන්දන්, වෙළඳසල්හිමියන් හා ජනතාව මෙන්ම අන් අයද හොඳින් මුහුණ දුන්නෝය.

කැරොලින් චිෂොම් (1808-77)

කැරොලින් චිෂොම් මුල් යටත්විජිතවල තනිකඩ කාන්තාවන්ගේ තත්ත්වය නගාසිටුවන ලද ප්‍රමුඛ සමාජ ප්‍රතිසංස්කරණවාදියෙකි. ඇය සිය හමුදා නිලධාරි ස්වාමිපුරුෂයා සහ දරුවන් පස්දෙනා සමඟ 1838දී ඕස්ට්‍රේලියාවට පැමිණියාය. ඇය සිඩ්නිහි වීදිවල ජීවත් වූ සංක්‍රමණික කාන්තාවන්ට උදව් කළාය. වසර කිහිපයක් තුළ ඇය යටත්විජිතය පුරා සංක්‍රමණික කාන්තාවන් වෙනුවෙන් නේවාසිකාගාර 16ක් පිහිටුවන ලදී.

යටත්විජිතවලට ගමන් කරන පුද්ගලයින්ට නැවෙහි ජීවිතය පහසු කිරීම සඳහා කැරොලින් වෙහෙස වී ක්‍රියා කළාය. ඇය යැපීමේ හා දරිද්‍රතාවයේ චක්‍රය බිඳීමට උපකාර කිරීම සඳහා අසරණ ජනතාව වෙනුවෙන් ණය සැලසුමක්ද සකස් කරන ලදී.

අද, ඕස්ට්‍රේලියාවේ බොහෝ පාසැල්කැරොලින් චිෂොම් නමින් නම් කර ඇත. ඇය සංක්‍රමණිකයාගේ මිත්‍රයා ලෙස හැඳින්වෙන අතර, නව ජීවිතයක් ආරම්භ කිරීමට මිනිසුන්ට උදව් කිරීමට ගන්නා ලද ප්‍රයත්නයන් වෙනුවෙන් ඇයව සිහිපත් කෙරේ.

ආණ්ඩුකාර මැක්වරි

ආණ්ඩුකාර පිලිප් සමඟ ආණ්ඩුකාර ලැක්ලාන් මැක්වරි අපගේ මුල් ඉතිහාසයේ වැදගත් ස්ථානයක් උසුලයි. ඔහු 1810 සහ 1821 අතර කාලය තුළ නිව් සවුත් වේල්ස් යටත්විජිතය පාලනය කළ අතර, එය රැඳවියන්ගේ යටත්විජිතයක් ලෙස නොව, නිදහසේ පදිංචි විය හැකි ස්ථානයක් ලෙස සංවර්ධනය කළේය. ඔහු වගාකිරිමේ පුරුදු වැඩිදියුණු කර, නව මාර්ග හා පොදු පහසුකම් ගොඩනගා, ඕස්ට්‍රේලියාව ගවේෂණය කිරීම දිරිමත් කළේය.

ආණ්ඩුකාර මැක්වරි අධ්‍යාපනය වෙනුවෙන් මුදල් ලබාදුන් අතර, මුල් රැඳවියන්ගේ අයිතීන්වලට ගරු කළේය. ඔහු සමහර මුල් රැඳවියන් වෙත විනිශ්චයකාරවරුන් හා රාජ්‍ය සේවකයින් ලෙස රැකියාව ලබා දුන්නේය.

ආණ්ඩුකාර මැක්වරි යටත්විජිතයට සිදු කරන ලද යහපත් වෙනස්කම් වෙනුවෙන් ඓතිහාසික ලෙස ගෞරවයට පාත්‍ර වේ. නිව් සවුත් වේල්සයේ මැක්වරි විශ්වවිද්‍යලය නම් කර ඇත්තේ ඔහුගේ නමිනි.

රැඳවි උරුමය

ආණ්ඩුකාර ධුරය එක් පුද්ගලයෙකු සතු වීම බලතල ඉක්මවා යාමක් ලෙස සිතුණු හෙයින්, 1823දී මීළඟ ආණ්ඩුකාරවරයා වෙත උපදෙස් ලබාදීම සඳහා හා යටත්විජිතය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා නිව් සවුත් වේල්ස් ව්‍යවස්ථාදායක සභාව පිහිටුවන ලදී.

මහා බ්‍රිතාන්‍යය 1840දී නිව් සවුත් වේල්සයට, 1852දී තස්මේනියාවට හා 1868දී බටහිර ඕස්ට්‍රේලියාවට රැඳවියන් යැවීම නතර කරන ලදී. සමස්තයක් ලෙස, රැඳවියන් 160,000කට වඩා වැඩි සංඛ්‍යාවක් ඕස්ට්‍රේලියාවට පිටත් කර හැරුණි. පෙර රැඳවියන් හා පදිංචිකරුවන් අතර බෙදීම නැති වී යන ලදී. 1850 සිට යටත්විජිතවාදීන් ස්වයං පාලනයේ යෙදුණු අතර, ඔවුන්ට ගෞරවාන්විත සමාජ ගොඩනැගීමට අවශ්‍ය විය. බොහෝ ඕස්ට්‍රේලියානුවෝ සිය රැඳවි උරුමය පිළිබඳව ආඩම්බර වෙති.

යුරෝපා පදිංචිකිරීම්වලින් පසුව ආදිවාසී ජනතාව

1788දී, යුරෝපා පදිංචිකිරීම් ආරම්භයේදී, ඕස්ට්රේලියාවේ ආදිවාසීන් 750,000ත් මිලියන 1.4ත් අතර ප්රමාණයක් ජීවත් වූවා යැයි ඇස්තමේන්තු කෙරේ. ඊට තනි ජාතීන් 250ක් හා 700කට වැඩි භාෂා කණ්ඩායම් ඇතුළත් විය.

ඕස්ට්රේලියාවේ සිය යටත්විජිත පිහිටුවීමේදී, බ්රිතාන්ය රජය ඇබොරිජිනල් ජනතාව සමඟ සම්මුතියකට එළඹුණේ නැත. තමන්ට මෙම භූමියට නීත්යනුකූලව හිමිකම් කිව හැකි බව බ්රිතාන්ය බලධාරීහු විශ්වාස කළහ.

ආදිවාසීන්ට තමන්ගේම ආර්ථිකයක් ද, භූමියට ඓතිහාසික සහ නොබිඳෙනසුළු සම්බන්ධතාවක් ද තිබිණි. තමන්ගේම නීතිය යටතේ වරක් ජීවත්වූ ස්ථානයේම ඔවුන්ට අලුතින් පැමිණි අයගේ නීති පිළිගන්නා ලෙස බල කෙරිණි. අලුතින් පැමිණි අයට ආරාධනා නොලැබුණු අතර, සාමාන්යයෙන් ඔවුන්ව පිළිගත්තේ නැත.

ආදිවාසීන්ගේ ජීවිත බ්රිතාන්ය යටත්විජිතවාදීන්ගේ ආගමනයත් සමඟ විශාල වශයෙන් වෙනස් විය. ජීවිත අහිමි වූ අතර, ඉඩම් ලබාගත් යටත්විජිතවාසීහු නව සමාජීය, ආර්ථික හා ආගමික නියමයන් පැනවීමට උත්සාහ කළහ. නව සතුන්, පැළෑටි හා රෝග හඳුන්වා දෙන ලදී.

ඇබොරිජිනල් පුද්ගලයින්ට හානි නොකරන ලෙස මුල් ආණ්ඩුකාවරුන්ට පවසා තිබුණද, බ්රිතාන්ය ජාතික පදිංචිකරුවෝ ඔවුන්ගේ ඉඩම්වලට ගොස් බොහෝ ඇබොරිජිනල් පුද්ගලයින්ව මරා දැමූහ. එවැනි අපරාධ සම්බන්ධයෙන් පදිංචිකරුවන්ට දඬුවම් කළේ නැත.

ඇතැම් ඇබොරිජිනල් පුද්ගලයින්ට සහ යුරෝපා පදිංචිකරුවන්ට සාමකාමීව එකට ජීවත්වීමට හැකි විය. සමහර පදිංචිකරුවෝ ඇබොරිජිනල් පුද්ගලයින්ව සතුන් බලාගැනීම සඳහා යෙදවූහ. ආණ්ඩුකාර මැක්වරි වගාකිරීම සඳහා ඇබොරිජිනල් පුද්ගලයින්ට වෙනම ඉඩම් ලබා දී, ඔවුන්ගේ දරුවන් සඳහා පාසැලක් ස්ථාපිත කළේය. කෙසේ වුවත්, ඉතාමත් සීමිත ඇබොරිජිනල් පුද්ගලයින් ප්රමාණයක් පමණක් පදිංචිකරුවන් ජීවත් වන ආකාරයට ජීවත්වන්නට කැමැත්ත පළ කළේ, සිය සංස්කෘතික සම්ප්රදායන් අහිමිකරගැනීමට ඔවුන්ට අවශ්ය නොවූ හෙයිනි.

බොහෝ ඇබොරිජිනල් පුද්ගලයෝ ඉඩම්වලට ඇතිකරගන්නා ලද ගැටුම්වලින් මරණයට පත් වූහ. නිශ්චිත සංඛ්යාව නොදනිතත්, ඇබොරිජිනල් පුද්ගලයෝ සිය ගණන්, දහස් ගණන් මිය ගියහ. යුරෝපීයන් මෙරටට රැගෙන ආ රෝගවලින් ඇබොරිජිනල් පුද්ගලයින් විශාල සංඛ්යාවක් මිය ගියේය. ඇබොරිජිනල් ජීවිතය අහිමි වීම ඛේදජනකය.

ඓතිහාසික සන්ධිස්ථාන

අභ්යන්තර දේශ ගවේෂණය

නිව් සවුත් වේල්සයේ මුල් කාලීන යටත්විජිතවාසියෝ අධික දුෂ්කරතාවලට මුහුණ දුන්හ. ආදිවාසීන් නියංකාලවලදී දුෂ්කරතාවලට මුහුණ දුන්නද, මෙම වියළි පරිසරයේ ජීවත්වන්නේ කෙසේද යන්න ඔවුන් ඉගෙන ගෙන තිබිණි.

බ්ලූ මවුන්ටන් (සිඩ්නිවලට ආසන්න වශයෙන් කිලෝමීටර් 50ක් බටහිරට) සිඩ්නිහි මුල්කාලීන ගවේෂකයින්ට විශාල අභියෝගයක් විය. 1813දී, ග්රෙගරි බ්ලැක්ස්ලන්ඩ්, විලියම් චාර්ල්ස් වෙන්ට්වර්ත් හා විලියම් ලෝසන් යන තිදෙනා අවසානයේ මෙම කඳු පන්තිය තරණය කිරීමට සමත් වූහ. අද, බ්ලූ මවුන්ටන් හරහා ඇති මාර්ගය හා දුම්රිය මාර්ගය ඔවුන් ගමන් කළ මාර්ගය හරහා දිවේ.

මෙම කඳුවලට අනෙක් පසින් ගවේෂකයෝ බැටලුවන් හා ගවයින් ඇති කිරීමට හොඳ විවෘත රටක් සොයාගත්හ. අභ්යන්තරයට පැමිණෙන විට, ඔවුන්ට වියළි කාන්තාරමය රටක් හමු විය.

යුරෝපීය ගවේෂකයින්ට දිවි රැකගැනීම සඳහා ජලය සොයාගැනීමටත්, ප්රමාණවත් ආහාර රැගෙනයාමත් ගැටලුවක් විය. ජර්මනියේ උපත ලද ලුඩ්විග් ලෙයිශ්හාර්ඩ්ට් මහාද්වීපයේ නැගෙනහිර සිට බටහිරට තරණය කිරීමට උත්සාහ කිරීමේදී 1848දී අතුරුදහන් විය.

1860දී, රොබර්ට් ඕ හාරා හා විලියම් ජෝන් විල්ස් ඕස්ට්රේලියාවේ දකුණේ සිට උතුරට යාමට මෙල්බර්න්වලින් පිටත් වූහ. ඔවුන් විශාල ගවේෂණයක් සිදු කළත්, එය අපහසු කාර්යයක් විය. බර්ක් හා විල්ස්ට කැළෑව පිළිබඳ අත්දැකීම් නොවීය. ඔවුන්ට ඇබොරිජිනල් යන්ද්රැවන්දා පුද්ගලයින්ගේ විශේෂඥ සහාය හිමිවුණ නමුත්, ගවේෂකයෝ නැවත පැමිණෙන අතරතුර මිය ගියහ. ඔවුන්ට සිය චාරිකාව අවසන් කිරීමට නොහැකි වුවද, ඔවුන්ගේ කථාව කලාවේ හා සාහිත්යයේ සිහිපත් කෙරේ. අපගේ භූමියේ කර්කශ බවට එය දුක්ඛදායක නිදසුනකි.

පදිංචිකරුවන් හා ප්‍රමුඛයින්

පදිංචිකරුවන්ට හොඳ ඉඩම් තිබුණද, ජීවිතය දුෂ්කර විය. ගංවතුර හෝ නියඟයකට පසුව, පදිංචිකරුවන්ට සිය ජීවනෝපාය අහිමි වූ අතර, ගොවියන්ට නැවත ආරම්භ කිරීමට සිදු විය. එසේ වුවත්, ජනතාව ඔවුන්ව නගාසිටුවා, සටන් කළහ. ඔසී බැට්ලර් යෙදුමෙන් ඕස්ට්‍රේලියානු සටන්කිරීමේ සහ ඔරොත්තු දීමේ හැකියාව නියෝජනය කරයි. මෙම දුෂ්කර කාලවලදී ප්‍රමුඛයින්ගේ ධෛර්යයට ගරු කෙරේ. පිරිමින් පිටතට ගිය විට හෝ මිය ගොස් ඇති විටෙක, කාන්තාවන්ට සිය ව්‍යාපාරයන් හෝ ගොවිපොලවල් පවත්වාගෙන යාමට සිදු විය.

මෙම දුෂ්කර කාලවලදී ඕස්ට්‍රේලියාවේ මිත්‍රත්වයේ ජීවගුණය ආරම්භ විය. ග්‍රාමීය ප්‍රදේශ හරහා සතුන් දක්කමින්, ලොම් කපමින් ගමන් කළ පිරිමින් අතර මෙය ප්‍රබල විය. දුෂ්කර කාලවලදී පදිංචිකරුවෝද එකිනෙකාට උදව් කරගත්හ. මෙම සම්ප්‍රදාය ඕස්ට්‍රේලියානු දිවියේ තවමත් වැදගත් කොටසකි.

රත්‍රන් සොයා යාම

1851 මුල් කාලයේ නිව් සවුත් වේල්සයේ රත්‍රන් සොයාගැනීම ජාතියක් වෙනස් කළ සොයාගැනීමක් ලෙස විස්තර කෙරේ. ඉන් ටික කලකට පසු, නව ස්වාධීන වික්ටෝරියා ප්‍රාන්තයේද රත්‍රන් සොයා ගැණිනි.

1852 අවසන් වන විට, ඕස්ට්‍රේලියාවේ සියලුම කොටස්වලින් හා ලෝකය වටින් පුද්ගලයින් ආසන්නව 90,000 පමණ රත්‍රන් සොයා වික්ටෝරියාවට පැමිණ තිබිණි.

ඕස්ට්‍රේලියානු ඉතිහාසයේ එක් ශ්‍රේෂ්ඨ ප්‍රජාතාන්ත්‍රික මොහොතක් ලෙස යුරේකා විප්ලවය සිහිපත් කෙරේ. රත්‍රන් හෑරීම සඳහා බලපත්‍ර ගාස්තු එකතු කිරීමේදී, කණින්නන් සම්බන්ධයෙන් රජයේ හමුදා ඉතා රළු විය. 1854 නොවැම්බර් 11වන දින, මිල අධික රත්‍රන් බලපත්‍ර ඉවත් කිරීම ඇතුළු මූලික ප්‍රජාතාන්ත්‍රික අයිතීන් හා වික්ටෝරියානු පාර්ලිමේන්තුවේ නියෝජිතයින් සඳහා ඡන්දය පාවිච්චි කිරීමේ හැකියාව පිළිබඳ සම්මුතියක් අදාල කරගැනීමට ආසන්න වශයෙන් පුද්ගලයෝ 10,000ක් බැලරාට්හි, බේකරි හිල් වෙත රැස් විය.

මෙයින් පසු 'යුරේකා දඬුවැට' ඉදිකරන ලද්දේ යුරේකා කැණීම්වල ය. එකිනෙකා වෙනුවෙන් නැගී සිට සිය අයිතීන් හා නිදහස වෙනුවෙන් සටන් කරන බවට විප්ලව ධජයක් (සදර්න් ක්රොස් රැගත්) සහිතව කණින්නන් විසින් ශපථ කළේ මෙතැනදීය. මෙම කණ්ඩායමට පහරදීමට 1854 දෙසැම්බර් 3වන දින උදෑසන රජයේ නිලධාරීන් විසින් සෙබලුන් පිටත් කර හරින ලදී. කෙටි ගැටුමකින් රත්රන් කණින්නන්ව මැඩලූ අතර, 30දෙනෙකු පමණ මිය ගියහ.


යුරේකා ධජය

ඉහළ රාජද්රෝහීභාවය වෙනුවෙන් විප්ලවකාරී නායකයින්ට එරෙහිව නඩු විභාගයක් පවත්වන ලද නමුත්, කිසිදු ජූරි සභාවක් විසින් ඔවුන්ව වැරදිකරුවන් කළේ නැත. රජය වැරදි බව රාජකීය කොමිසමක් මගින් තීරණය කරන ලද අතර දේශපාලන නියෝජනය සඳහා සිය අපේක්ෂාවන් ඇතුළු පතල් කණින්නන්ගේ ඉල්ලීම් බොහෝමයක් ඉටු විය. වසරක් තුළ විප්ලවවාදීන්ගේ නායකයා වූ පීටර් ලාලෝර් වික්ටෝරියානු පාර්ලිමේන්තුවේ මන්ත්රීවරයෙකු විය.

වසර ගණනාවක් පුරා, යුරේකා විප්ලවය අරගලවල සංකේතයක් මෙන්ම සාධාරණ අවස්ථා පිළිබඳ විශ්වාසයක් බවට පත්ව ඇත.

රත්රන් සොයාගිය ගමන ඕස්ට්රේලියාව විවිධාකාරයෙන් වෙනස් කළේය. රත්රන් සොයා ගිය වර්ෂවලදී, ඕස්ට්රේලියාවේ ආදිවාසී නොවන ජනගහනය 1851දී ආසන්න වශයෙන් 430,000 සිට 1871දී මිලියන 1.7 දක්වා ඉහළ ගියේය. වර්ධනය වන ජනගහනය සම්බන්ධ කිරීම සඳහා පළමු දුම්රියමාර්ග සහ විදුලි පණිවුඩ සේවාව ඇති කරන ලදී.

දකුණු ඕස්ට්රේලියාවේ හැර අනෙක් සියලුම ප්රාන්තවල විශාල රත්රන් සංචිත හමු විය. ආර්ථිකය වර්ධනය වෙමින් තිබුණු අතර, රත්රන් ඕස්ට්රේලියාවේ වටිනාකමින් වැඩිම අපනයන භාණ්ඩය ලෙස ලොම් පැරදවීය. 1890 පමණ වන විට, ලෝකයේ ඉහළම ජීවන මට්ටම්වලින් එකක් ඕස්ට්රේලියාව සතු විය.

අනවසර පදිංචිකරුවන් සහ ගොවියන්

ප්රාන්තවල මුල් කාලයේදී වගාකිරීම සඳහා අනවසර පදිංචිකරුවන් විසින් ඉඩම් විශාල ප්රමාණයක් ලබාගන්නා ලදී. ඔවුන් මෙම භූමිය සඳහා ගෙවීම් නොකළද, අනවසර පදිංචිකරුවෝ ඒවා තමන්ගේ යැයි සිතූහ. පළමු රත්රන් සොයායාම අවසන් වූ විට, අනවසර පදිංචිකරුවන්ගෙන් මෙම ඉඩම් නැවත ලබාගැනීමට රජයට අරගල කිරීමට සිදු විය.

1860දී, මෙම අනවසර පදිංචිකරුවන්ගේ ඉඩම් වගාකිරීම සඳහා වැඩකරන පුරුෂයින්ට හා කාන්තාවන්ට විකිණීමට රජයට අවශ්ය විය. අනවසර පදිංචිකරුවෝ හැකිතාක් ඉඩම් තමන් සතුව තබාගැනීමට උත්සාහ කළෝය.

දුම්රිය මාර්ග සාදන තෙක්, වෙළඳපොළින් ඈතින් පිහිටි ගොවිපොලවල නව ගොවියෝ දුෂ්කරතාවලට මුහුණ පෑවෝය. මහා නගරවල ඉහළ වේතනයක් ඉපැයීමේ අවස්ථාව ගොවිපොලවල ජීවිතය ගෙනයාමේ සහ කුඩා ප්රතිලාභයක් වෙනුවෙන් වැඩකිරීම අසතුටුදායක විය.

වගාකිරීම පහසු කිරීම සඳහා යන්ත්රෝපකරණ නිපදවීමේ ඕස්ට්රේලියානු සාම්ප්රදාය දකුණු ඕස්ට්රේලියාවෙන් ආරම්භ විය. නිදසුනක් ලෙස, වගාකිරීම සඳහාස්ටම්ප්-ජම්ප් නගුල (1870) මගින් පහසුවෙන් කර්කශ භූමිය පිරිසිදු කළ හැකි හැකි විය.

1800දී සංක්රමණය වීම

1800 මුල් සමය වන විට, ප්රාන්තවල ජීවත් වූ ප්රධාන කණ්ඩායම් ඉංග්රීසි, ස්කොට්, වේල්ස් හා අයිරිෂ් සම්භවයකින් යුක්ත විය. ඕස්ට්රේලියාවේ බොහෝ විනෝදාංශ, සංස්කෘතික ක්රියාකාරකම් හා ආගමික ක්රියාකාරකම් මගින් බ්රිතාන්ය සාරධර්ම නිරූපණය විය. යුරෝපයෙන් සහ ආසියාවෙන් පැමිණි කුඩා සංක්රමණික කණ්ඩායම් ද විය. 1800දී පැමිණි යුරෝපා ජාතිකයින් අතරට ඉතාලි, ග්රීක, පෝලන්ත, මෝල්ටා සහ රුසියානු ජාතිකයින් ඇතුළත් වූ අතර, වයින් කර්මාන්තයේ සේවය කරන ප්රංශ පදිංචිකරුවෝද ඇතුළත් වූහ. ඔවුන්ගෙන් බොහොමයක් රැකියා සහ වාසනාව සොයා ගිය තරුණයෝ සහ සිය නැව්වලින් අතරමං වූ නැවියෝ වූහ.

1842න් පසු, චීන සංක්රමණිකයින් ඕස්ට්රේලියාවට පැමිණීම ආරම්භ වූ අතර, රන් සොයාගැනීමෙන් අනතුරුව, එම සංඛ්යාව ඉහළ ගියේය. රත්රන් සහිත භූමි වෙනුවෙන් ජාතිවාදී නොරිස්සුම් ඇති වු අතර, මේවා ඇතැම් අවස්ථාවන්හිදී චීන ජාතිකයින්ට එරෙහි අරගල බවට පත් විය. එයින් එකක් වූයේ, 1854දී බෙන්ඩිගෝහි ඇති වූ අරගලය දැක්විය හැකිය. මෙම ජාතිවාදී නොරිස්සුම්භාවය හේතුවෙන් 1855දී වික්ටෝරියා ප්රාන්තයේ සහ 1861දී නිව් සවුත් වේල්ස් ප්රාන්තයේ සංක්රමණය පිළිබඳ පළමු සීමාවන් පනවන ලදී.

1850 රන් සොය යාමෙන් අනතුරුව, බොහෝ චීන ජාතිකයෝ නිවෙස් බලා පිටත් වූහ. එසේ රැඳී සිටිය අය අතර, ජලය හිඟ පෙදෙස්වලට අත්‍යවශ්‍ය අලුත් පලතුරු සහ එළවළු සපයන ලද වෙළඳපොල වෙනුවෙන් වගාකරන්නෝ සිටියහ.

1860 ගණන්වල සිට, ඕස්ට්‍රේලියාවේ ග්‍රාමීය ප්‍රදේශවල ඔටු දුම්රිය ක්‍රියාත්මක කිරීම සඳහා ඉරානයෙන්, ඊජිප්තුවෙන් හා තුර්කියෙන් පුද්ගලයෝ පැමිණියහ. ඉන්දියානු ඔටුවන් පිට යන්නන් සමඟම, ඔවුන් සරල ලෙස ඇෆ්ගන් ජාතිකයින් ලෙස හඳුන්වන ලද අතර, එය විශාල වශයෙන් ඔවුන්ගේ සමාන ඇඳුම් හා පොදු ඉස්ලාමීය ආගමික විශ්වාසයන් නිසා සිදු විය. මෙම ඔටුවන් පිට යන්නන් අභ්‍යන්තර ප්‍රදේශවල ප්‍රමුඛයින් ලෙස හැඳින්වීය.

බොහෝ විට ඉතා අඩු වේතනයකට සහ අවම සේවා තත්ත්වයන් යටතේ ක්වීන්ස්ලන්තයේ සීනි හා කෙසෙල් කර්මාන්තවල සේවය කළ ඉන්දියානුවෝ මෙන්ම පැසිෆික් දූපත් වැසියන් ද සිටියහ.

1880 සිට, ලෙබනනයේ සිට ඕස්ට්‍රේලියාවට වැඩකරුවෝ පැමිණියහ. බොහෝ අය රෙදිපිළි කර්මාන්තයට සම්බන්ධ වී සිටි අතර, ලෙබනන් පවුල් ඕස්ට්‍රේලියාවේ ඈත පෙදෙස්වල තිරරෙදි ව්‍යාපාර රැසක අයිතිකරුවෝ වූහ.



ඕස්ට්‍රේලියාවේ ග්‍රාමීය පළාත්හි වෙසෙන ඇෆ්ගන් ජාතික ඔටුවන් පිට යන්නන්

ආදිවාසී රක්ෂිත

ආදිවාසීන් සහ පදිංචිකරුවන් අතර ඉඩම් වෙනුවෙන් සිදු කරන ලද මුල් කාලීන ගැටුම්වලින් අනතුරුව, ආදිවාසීන්ට සමාජයෙන් කොන්වී ජීවත්වීමට සිදු විය. සමහර පුද්ගලයෝ ග්‍රාමීය ප්‍රදේශවල ඉතා අඩු වේතනයකට බැටලුවන් හා ගවයින් ඇති කරන ස්ථානවල වැඩ කරන ලද අතර, බොහෝ අවස්ථාවන්හිදී ඔවුන්ට ගෙවීම් සිදු කළේ නැත. ප්‍රාන්ත රජයන් විසින් ආදිවාසී ජනතාවට ජීවත් විය හැකි රක්ෂිත පිහිටවූ නමුත්,මෙම ප්‍රදේශ තුළ ඔවුන්ගේ සාම්ප්‍රදායික ජීවිත ගෙවීමට ඉඩක් නොමැති විය. නිදසුනක් ලෙස, ඔවුන්ට කැමති පරිදි දඩයම් කිරීමට හෝ එක්රැස්වීමට නිදහස නොමැති විය.

1800 අග කාලයේදී, ප්‍රාන්ත රජයන් විසින් ආදිවාසී ජනතාවගේ අයිතීන් උදුරා ගන්නා ලදී. ආදිවාසී ජනතාවට ජීවත් විය හැක්කේ කොහේද සහ ඔවුන් විවාහ විය යුත්තේ කා සමඟද යන්න ඔවුහු තීරණය කළහ. ඔවුන් බොහෝ ආදිවාසී දෙමව්පියන්ගෙන් සිය දරුවන් රැගෙන යන ලද අතර, එම දරුවන් සුදු ජාතික පවුල් වෙත හෝ රජයේ අනාථ නිවාස වෙත යවන ලදී. මෙවැනි ප්‍රතිපත්ති 20වන සියවසේ මැද දක්වා එලෙසම පැවතිණි. බොහෝ ආදිවාසී ජනතාවට සහ වෙනත් ඕස්ට්‍රේලියානුවන්ට සොරකම් කරන ලද පරම්පරාවන්ගේ ගැටලුව අතිශය දුක්බදායක කරුණක් වූ අතර, 2008දී ඕස්ට්‍රේලියානු පාර්ලිමේන්තුවේදී ජාතියෙන් සමාව ඉල්ලීමට තරම් කරුණක් විය.

ඡන්ද බල අයිතිය සඳහා සටන් කරන්නන්

ඡන්ද බල අයිතිය සඳහා සටන් කරන්නන් යන යෙදුම මැතිවරණවලදී ඡන්දය පාවිච්චි කිරීමේ අයිතිය සඳහා සටන් කරන ලද කාන්තාවන් වෙනුවෙන් ලෝකය පුරා භාවිත කරන ලදී. 1880 සහ 1890 අතර කාලසීමාව තුළ සෑම ප්‍රාන්තයකම ඡන්ද බල අයිතිය සඳහා සටන් කරන එක් සංගමයක් අවම වශයෙන් තිබිණි. සිය ප්‍රාන්ත පාර්ලිමේන්තුවලට ඉදිරිපත් කිරීම සඳහා ඡන්ද බල අයිතිය සඳහා සටන්කරුවෝ පෙත්සම්වලට අත්සන් දහස් ගණනක් එකතු කළෝය.

1895දී, දකුණු ඕස්ට්‍රේලියාවේ කාන්තාවෝ ඡන්දය පාවිච්චි කිරීමට සහ පාර්ලිමේන්තුවට තේරීපත්වීමට අයිතිය දිනාගත්හ. 1899දී, බටහිර ඕස්ට්‍රේලියාවේ කාන්තාවෝ ඡන්ද අයිතිය දිනාගත්හ.

1902දී, කාන්තාවන්ට ඡන්දය පාවිච්චි කිරීමේ අයිතිය සහ පාර්ලිමේන්තුවට තේරී පත්වීමේ අයිතිය යන අයිතීන් දෙකම ලබා දුන් ප්‍රථම රට වන්නේ ඕස්ට්‍රේලියාවයි. 1962 වන තෙක් ආදිවාසී ජනතාව වෙත ඡන්ද බල අයිතිය ලබා දුන්නේ නැත.

1923දී, බටහිර ඕස්ට්‍රේලියානු පාර්ලිමේන්තුවට තේරී පත් වූ විට එඩිත් කොවන් පළමු පාර්ලිමේන්තු මන්ත්‍රීවරිය බවට පත් විය. 1943දී, ඊනිඩ් ලියොන්ස් ඕස්ට්‍රේලියානු පාර්ලිමේන්තුවට තේරී පත්වූ පළමු කාන්තාව විය.

කැතරින් ස්පෙන්ස් (1825-1910)

කැතරින් ස්පෙන්ස් ලේඛිකාවක, දේශකයෙකු, ස්ත්‍රී ක්‍රියාකාරිකයෙකු මෙන්ම ඡන්ද බල අයිතිය සඳහා සටන් කරන ලද ක්‍රියාකාරිකයෙකුද විය. ඇය ස්කොට්ලන්තයේ සිට ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වූ අතර, ඕස්ට්‍රේලියානු දිවිය පිළිබඳ පාසල් පොත් සහ ත්‍යාග දිනන ලද නවකථා ලිව්වාය.

ඇය නිවාස අහිමි දරුවන්ට උදව් කිරීම සඳහා සංවිධානයක් පිහිටුවීමට ආධාර කළ අතර, ගැහැණු දරුවන් සඳහා නව පෙරපාසල් සහ රජයේ ද්විතීයික පාසැල් සඳහා සහයෝගය ලබා දුන්නාය.

පාර්ලිමේන්තුවට තේරීපත්වීම සඳහා තරඟ වැදුණු ප්‍රථම කාන්තාව ඇයයි. ඇයට බොහෝ ඡන්ද ප්‍රමාණයක් හිමි වුවද, ආසනය දිනාගැනීමට නොහැකි විය. 1891දී, ඇය දකුණු ඕස්ට්‍රේලියාවේ කාන්තාවන්ගේ ඡන්ද බල අයිතිය ලබාගැනීමේ ලීගයේ උප සභාපති බවට පත් විය.

සීමාසහිත කාලසීමාවක වුවද කාන්තාවකට කුමක් ජයගතහැකිද යන්න සඳහා කැතරින් ස්පෙන්ස් කදිම සලකුණකි.

සමූහාණ්ඩුව

යටත්විජිත වෙන් වෙන් වශයෙන් සංවර්ධනය වී තිබුණද, 19වන සියවසේ අග වන විට, ජාතික වශයෙන් එක්වීමේ පොදු අදහසක් වර්ධනය වී තිබිණි.

19වන සියවසේ අවසානයේදී, යටත්විජිත එක්කිරීමට ප්‍රයත්නයන් දෙකක් දරන ලදී. 1889දී, ශ්‍රීමත් හෙන්රි පාර්ක්ස් විසින් නව ශක්තිමත් ජාතියක් බිහි කිරීම සඳහා අදහස් ඉදිරිපත් කරන ලදී. ඕස්ට්‍රේලියානු සමූහාණ්ඩුවක් බිහි කිරීමේ අදහස පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා 1890දී ඕස්ට්‍රේලියානු ෆෙඩරේෂණ සමුළුව පවත්වන ලදී.

පෙඩරල රාජ්‍යයක් වෙනුවෙන් ඉදිරියට යාම යම් යම් ප්‍රමාදයන්ගෙන් අනතුරුව 1893දී වේගවත් විය. ඡන්දදායකයෝ මීළඟ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්මුතියේ සාමාජිකයින් තෝරාගත්හ. නව ඕස්ට්‍රේලියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ලබාගැනීම වෙනුවෙන් ඡන්දදායකයෝ ජනමත විචාරණ වට දෙකකදී ඡන්දය පාවිච්චි කළහ.

ඕස්ට්‍රේලියාවට ස්වයං නිර්ණය කළ හැකි බව බ්‍රිතාන්‍ය රජය එකඟ විය. 1 නිව් සවුත් වේල්ස්හි පෙඩරල රා ජ්‍යවෙනුවෙන් හඬ නගන ලද එඩ්මන්ඩ් බාර්ටන් 1901 ජනවාරි 01වන දින ඕස්ට්‍රේලියාවේ පළමු අගමැතිවරයා බවට පත් විය. ඔහුගේ රජය සිඩ්නිහි සෙන්ටනියල් පාර්ක්හිදී විශාල ජනකායක් ඉදිරියේ දිවුරුම් දෙන ලදී.

1901 දී බ්‍රිස්බේන් නුවර පවත්වන ලද ෆෙඩරේෂණ දිනය

ඕස්ට්‍රේලියාව එවකට බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය තුළ පැවති එක් ජාතියක් විය. 1931 වන තෙක් රැට ආරක්ෂාව සහ විදේශ කටයුතු පිළිබඳ පූර්ණ බලතල හිමි වූයේ නැත. 1948 ඕස්ට්‍රේලියානු පුරවැසි පනත ගෙන එන තෙක්, ඕස්ට්‍රේලියානුවන් මෙහි පුරවැසියන් වනවාට වඩා බ්‍රිතාන්‍ය ජනතාව ලෙසට සැලකිණි. ජාතික හැඟීම වර්ධනය වී තිබුණද, බ්‍රිතාන්‍යයට අයත් යන හැඟීම තවදුරටත් ශක්තිමත්ව පැවතිණි.

එඩිත් කොවන් (1861-1932)

එඩිත් කෝවන් ඕස්ට්‍රේලියානු පාර්ලිමේන්තුවට තේරී පත් වූ පළමු කාන්තාව වන අතර එය ඕස්ට්‍රේලියාවේ ඩොලර් පනහ නෝට්ටුවේ දැක්වේ.

එඩිත් කාන්තාවන්ගේ ඡන්දය ප්‍රකාශ කිරීමේ ව්‍යාපාරයේ ප්‍රමුඛයා වූ අතර මහජන අධ්‍යාපනය සහ දරුවන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් කටයුතු කළ ප්‍රමුඛ පෙළේ උපදේශකයෙකි. එඩිත් 1915 දී මහේස්ත්‍රාත්වරයකු ලෙසත් 1920 දී සාමාදාන විනිශ්චයකරුවකු ලෙසත් පත් කරන ලදී.
1921 දී එඩිත් බටහිර ඕස්ට්‍රේලියාවේ ව්‍යවස්ථාදායක සභාවට ජාතිකවාදී පක්ෂයේ සාමාජිකයෙකු ලෙස

දේශපාලන පක්ෂවල උපත

1880 වන විට, ඕස්ට්‍රේලියාවේ වැඩ කරන ජනතාව ශක්තිමත් වෘත්තීය සංගම් නිර්මාණය කළහ. ආර්ථික අවපාත සහ නියං සමයකදී, මෙම සංගම් වේතන සහ වැඩකිරීමේ තත්ත්වයන් ආරක්ෂා කරගැනීම සඳහා වැඩවර්ජන පැවැත්වූහ.

1891දී, මෙම වැඩ කරන ජනතාව විසින් කම්කරු පක්ෂය නමින් දේශපාලන පක්ෂයක් නිර්මාණය කරන ලදී. එහි ප්‍රධාන අවධානය යොමු වූයේ, වැඩ කරන ජනතාවගේ වේතන හා තත්ත්වයන් වැඩිදියුණු කිරීමයි. වැඩ කරන පුද්ගලයින්ට වඩා මධ්‍යම පන්තියේ පුද්ගලයින් හොඳින් ජීවත් වූ නමුත්, ඔවුහු වැඩ කරන ජනතාවගේ තත්ත්වය තේරුම් ගත්හ. වේතන නියම කිරීමට සහ වැඩවර්ජන වැළැක්වීමට නිලධාරි මණ්ඩල පිහිටුවන ලදී. 1907දී, පොදුරාජ්‍ය මණ්ඩලීය සංහිඳියා සහ බේරුම්කරණ අධිකරණය මගින් වැඩ කරන පුරුෂයෙකුට, ඔහුගේ බිරිඳට සහ දරුවන් තිදෙනෙකුට සාමාන්‍ය ලෙස පහසුවෙන් ජීවත් විය හැකි මට්ටමක අවම වේතනයක් නිර්ණය කරන ලදී.

1910දී, ලිබරල් පක්ෂයේ පළමු මට්ටම නිර්මාණය කරන ලදී. මෙම පක්ෂයට වසර ගණනාවක් විවිධ නම් භාවිත වූ අතර, ඊට ජාතීන්ගේ පක්ෂය සහ එක්සත් ඕස්ට්‍රේලියා පක්ෂය ඇතුළත් විය. 1944දී, අද ලිබරල් පක්ෂය ලෙස හඳුන්වන පක්ෂය රොබර්ට් මෙන්සිස් විසින් නිර්මාණය කරන ලද අතර, ඔහු ඕස්ට්‍රේලියාව දීර්ඝ කාලයක් පාලනය කරන ලද අගමැතිවරයා බවට පත් විය.

පළමු ලෝක යුද්ධයෙන් පසු, ගොවියන්ගේ ගැටලුවලට මැදිහත්වීම ඉහළ නැංවීම සඳහා කන්ට්‍රි පක්ෂය නිර්මාණය කරන ලදී. දැන් එයජාතික පක්ෂය වශයෙන් හඳුන්වන අතර, සාමාන්‍යයෙන් ලිබරල් පක්ෂය සමඟ සන්ධානගතව කටයුතු කරයි.

1901 සංක්‍රමණ සීමාකිරීමේ පනත

1901 දෙසැම්බර් මාසයේදී සංක්‍රමණ සීමාකිරීමේ පනත සම්මත කළ අවස්ථාවේදී, ‘White Australia’ ප්‍රතිපත්තිය නීතියක් බවට පත් විය. මෙමගින් සංක්‍රමණිකයින් ඕස්ට්‍රේලියාවේ වැඩ කිරීම සහ සුදු නොවන පුද්ගලයින් සංක්‍රමණය වීම සීමා කරන ලදී.

යුරෝපීය නොවන සම්භවයක් සහිත පුද්ගලයින්ට යුරෝපීය භාෂාවකින් වචන 50ක කියවන විට ලිවීමේ පරීක්ෂණයකට මුහුණ දීමට සිදු විය. චීන වෙළඳ සංගමයේ සාමාජිකයින්, බැරිස්ටර්වරයෙකු වූ විලියම් අහ් කෙට් සහ ප්‍රමුඛ පෙළේ චීන ජාතික ව්‍යාපාරිකයින් ප්‍රසිද්ධියේ විරෝධතාව දැක්වූවද, මෙම නීතිය වෙනස් කිරීමෙහි ලා එය සාර්ථක වූයේ නැත.

යුරෝපයෙන් පැමිණි සංක්‍රමණිකයෝ අලුතින් බිහි කරන ලද පෙඩරල රාජ්‍යය යේ පුරෝගාමියෝ වූහ. කෙසේ වුවත්, චීන, ඉන්දියානු, පැසිෆික් දූපත්වාසීන් සහ මැදපෙරදිගින් පැමිණි පුද්ගලයින්ගේ සංස්කෘතික දායකත්වයන් ඕස්ට්‍රේලියාවේ සමාජ අනන්‍යතාවයේ කොටසක් බවට පත්ව තිබිණි.

ඩොරතිය මැකෙලර් (1885-1968)

ඩොරතිය මැකෙලර් යනු 1908 දී ප්‍රථම වරට ප්‍රකාශයට පත් කරන ලද මගේ රට කාව්‍යය සඳහා වඩාත් ප්‍රසිද්ධියට පත් කිවිඳියකි. එහි 'මම අව් රශ්මිය ඇති රටකට ආදරෙයි' යන පාදය අමරණීය විය. වයඹදිග නිව් සවුත් වේල්ස් හි ගුනෙඩා අසල ඇගේ සහෝදරයන්ගේ ගොවිපලවල් පිළිබඳ ඇගේ අත්දැකීම් මගින් නිමැවුණු ඇගේ කවි ඉතා වැදගත් බුෂ් කවි ලෙස සැලකේ.

1968 දී ඩොරතිය ඕස්ට්‍රේලියානු සාහිත්‍යයට දැක්වූ දායකත්වය වෙනුවෙන් Officer of the Order of the British Empire ලෙස නම් කරන ලදී.

පළමු ලෝක යුද්ධය (1914-18)

පදිංචි කරවූ පුද්ගලයින් හා ඇබොරිජිනල් ආදිවාසීන් අතර ගැටුම් හැරුණුකොට, ඕස්ට්‍රේලියාවට සාමකාමී ඉතිහාසයක් පැවතිණි. මෙහි කිසිදු සිවිල් යුද්ධයක් හෝ විප්ලවයක් හෝ තිබුණේ නැත.

ඕස්ට්‍රේලියානු පරම්පරා ගණනාවක් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට පක්ෂපාතීව සිටියේය.

විශේෂයෙන් ජපානය බලවත් වීමෙන් අනතුරුව, ආසියාවට ආසන්න ප්‍රත්‍යන්ත යුරෝපා ජනපදයක් ලෙස ඕස්ට්‍රේලියාවට ඓතිහාසික අවදානමක් ඇති බවක් දැනුණි. ඕස්ට්‍රේලියාව ආරක්ෂා කිරීම සඳහා අපි බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය සහ එහි නාවික ශක්තිය මත රඳා පැවතියෙමු. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය ශක්තිමත්ව පවත්වාගෙන යාමට සහ ඕස්ට්‍රේලියාව ආරක්ෂා කිරීමට ඕස්ට්‍රේලියාව ලෝක යුද්ධ දෙකේදීම සටන් කරන ලදී.

ඕස්ට්‍රේලියාව පළමුවන ලෝක යුද්ධයට අවතීර්ණ වූයේ 1914 අගෝස්තු මාසයේදී වන අතර 1915 දී ජර්මනියේ සගයා වන තුර්කියට පහර දීමට සහභාගී විය. ඕස්ට්‍රේලියානු සහ නවසීලන්ත හමුදා බලඇණිවල (ඇන්සැක්) පිරිමින්ට සටන් කිරීම සඳහා ගැලිපොලි අර්ධද්වීපයේ ඔවුන්ගේම කොටසක් ලබා දෙන ලදී.

තුර්කි හමුදාවන් වෙඩි තබන විට ඔවුන්ට බෑවුම් සහිත කඳු නැගීමට සිදු විය. කෙසේ වුවද, බොහෝ තරුණයින් මිය ගියද. ඔවුහු කඳු මුදුන් තරණය කර, උමං හෑරීමට පටන් ගත්හ. මෙරට සිටි ඕස්ට්‍රේලියානුවෝ ඇන්සැක්හි උද්දාමය අසීමිත ආඩම්බරයකින් යුතුව විඳගත්හ.

ගැලිපොලිවලින් පසුව, ඕස්ට්‍රේලියානු හමුදාවන් ප්‍රංශයේ සහ බෙල්ජියමේ බටහිර පෙරමුණේ සටන් වැදුණි. ඔවුන්ට හාරන්නන් යන නම ලැබුණේ ඔවුන් වැඩි වේලාවක් හෑරීමට සහ අගල් සෑදීමට වැය කළ හෙයිනි. සිය සේනාධිනායකයා වූ ලුතිනන් ජනරාල් ශ්‍රීමත් ජෝන් මොනෑෂ් විසින් නායකත්වය ලබා දෙන ලද ඕස්ට්‍රේලියානු හාරන්නෝ ජර්මනියට එරෙහි අවසන් ගැටුම්වලින් ජය ලද අතර, ඔවුන්ට සහාය පල කළ ප්‍රංශ ජාතිකයින්ගේ කෘතඥතාවද දිනාගන්නා ලදී.

ඕස්ට්‍රේලියානු සෙබල සෙබලියෝ සූවස් ඇලේ ආරක්ෂාව සහ සිනායි අර්ධද්වීපයේ සහ පලස්තීනයේ මිත්‍ර ආක්‍රමණවලට සහභාගිවෙමින් මැද පෙරදිගද සේවය කර ඇත.

සිම්ප්සන් සහ ඔහුගේ බූරුවා - ජෝන් සිම්ප්සන් කර්ක්පැට්රික් (1892-1915)

ප්‍රයිවට් ජෝන් සිම්ප්සන් ගැලිපොලිහි ගිලන්රථ වෛද්‍ය බල ඇණියේ ලෙඩුන් ගෙනයන මැස්ස රැගෙනයන්නෙක් ලෙස සේවය කළේය. කඳු සහ නිම්න හරහා ගිලන් මැස්ස රැගෙන යාම දුෂ්කර විය. හමුදා නියෝගයට පටහැනිව ඔහු තුවාලලත් සෙබලු ආරක්ෂිතව නැවත රැගෙන ඒමට උපකාරවීම සඳහා ඩෆී නමින් හඳුන්වන ලද බූරුවෙකු යොදාගත්තේය.

දවල් රෑ, පැයෙන් පැය, සිම්ප්සන් සහ ඔහුගේ බූරුවා ගැටුම් ඇති ස්ථානය සහ වෙරළ කඳවුර අතර ගමන් කරමින් සිය ජීවිත අවදානමේ හෙළීය.

1915 අප්රේල් 25වන දින ප්‍රයිවට් ජෝන් සිම්ප්සන් ගැලිපොලි වෙත ළඟාවිය. සති හතරකට පසුව සතුරන්ගේ මැෂින් තුවක්කුවලින් ඔහුව මරා දමන ලදී. සිය තරුණ හිමිකරුවා නොමැතිව තුවාලලත් සෙබලෙක් පිට දරාගෙන වෙරළ දෙසට ඇදෙන ඩෆී දකින විට වෙරළ කඳවුරේ සිටි සෙබල පිරිස නිහඬව දුක්මුසු මුහුණින් බලා සිටියේය. ජෝන් සිම්ප්සන් කර්ක්පැට්රික් යනු ඕස්ට්රේලියානු පුරාවෘත්තයකි.



ඇන්සැක් පුරාවෘත්තය

ඇන්සැක් සම්ප්‍රදාය තුර්කියේ ගැලිපොලි අර්ධද්වීපය මත ආරම්භ විය.

1915 අප්‍රේල් 25 වන දින ගැලිපොලිහි ගොඩබෑම එක් ව්‍යාපාරයක ආරම්භය සනිටුහන් කරන ලද අතර, එය මාස අටක් පුරාවට පැවතිණි. එය, රෝග නිසාවෙන් මියගිය හෝ මරා දමන ලද 8000කට වැඩි සංඛ්‍යාව ඇතුළු 26,000කට අධික ඕස්ට්‍රේලියානුවන් සංඛ්‍යාවක් මියයාමට හේතු විය. ගැලිපොලි අර්ධද්වීපය මත සේවය කළ අයගේ නිර්භීතභාවය සහ ආධ්‍යාත්මය පුරාවෘත්තයක් නිර්මාණය කරන ලද අතර, ඇන්සැක් යන වදන ඕස්ට්‍රේලියානු සහ නවසීලන්ත භාෂාවේ කොටසක් බවට පත් වී ඇත.

1916 අප්‍රේල් 25 වන දින, ඕස්ට්‍රේලියාව, නවසීලන්තය, එංගලන්තය සහ ඊජිප්තුවේ බල ඇණි මෙම ගොඩබෑමේ පළමු සංවත්සරය අත්විඳින ලදී. එතැන් සිට, අප්‍රේල් 25 ඇන්සැක් දිනය ලෙස හැඳින්වේ.

1920 වන විට, ඕස්ට්‍රේලියාව පුරා ඇන්සැක් දින සැමරුම් පවත්වන ලද අතර, ප්‍රාන්ත විසින් ඇන්සැක් දිනය රජයේ නිවාඩු දිනයක් ලෙස නම් කරන ලදී. අගනුවරවල්හි ප්‍රධාන යුධ අනුස්මරණ ස්මාරක ගොඩනගා ඇති අතර, දේශය පුරා නගර සහ මහානගරවල දක්නට ඇති ස්මාරක එම ගැටුම්වලදී හෝ පසුව ඇති වූ ගැටුම්වලදී මිය ගිය තරුණ, තරුණියන් වෙත උපහාරයකි.

ඇන්සැක් දිනය, යුද්ධවලදී, ගැටුම්වලදී සහ සාමසාධක මෙහෙයුම්වලදී සේවය කළ සියලුමදෙනාට සහ ඔවුන්ගේ මිත්‍රත්වය, විරෝධතාව ඉදිරියේ ඉවසීම හා අපගේ අනාගතය වෙනුවෙන් සිදු කරන ලද පරිත්‍යාගයන්වලට ගරුත්වය පල කරන දිනයකි. එදින යුද්ධයේ විවිධ අර්ථ නිරූපණ කරන දිනයක් ද වේ.

අද, ඇන්සැක් දිනය ඕස්ට්‍රේලියාවේ මෙන්ම ලෝකය පුරා සැමරේ. නැවත පැමිණි ඕස්ට්‍රේලියානු යුධ සෙබල, සෙබලියෝ, වෙනත් රටවල සිට පැමිණි සාමසාධක හමුදා සාමාජිකයෝ හා විශ්‍රාමික යුධ හමුදා නිලධාරීයෝ සියලුදෙනා ඇන්සැක් දින පෙළපාලියේදී ආඩම්බරයෙන් ගමන් කරති.

මහා ආර්ථික අවපාතය (1929-32)

මහා ආර්ථික අවපාතය ඕස්ට්‍රේලියානු ජනතාව වෙත අතිශයින් දුෂ්කර කාලසීමාවක් විය. 1929 ඔක්තෝබර් මාසයේදී නිව්යෝර්ක් කොටස් වෙළඳපොල හුවමාරුව කඩාවැටීමත් සමඟ එය ආරම්භ විය. ඕස්ට්‍රේලියාවේ සිදු වූ අවපාතයට හේතු වූ කරුණු අතරට ඕස්ට්‍රේලියානු භාණ්ඩවල මිල පහත වැටීම සහ සේවායෝජකයින් විසින් රැකියා සහ වේතන කප්පාදු කිරීම නිසා ඇති වූ කාර්මික අංශයේ අසහනකාරී බව ඇතුළත්ය. 1932 වර්ෂයේ මැද වන විට, ඕස්ට්‍රේලියානුවන්ගෙන් සියයට 32ක ප්‍රමාණයක් රැකියා විරහිත විය.

අවපාතය නිසා ඕස්ට්‍රේලියානු සමාජයට වූ බලපෑම අතිවිනාශකාරීය. බොහෝ ජනතාවට රැකියාවක් හෝ ස්ථිර ආදායමක් නොමැතිව නිවාස අහිමි විය. ඔවුන්ට උණුසුම් කිරීමේ යන්ත්‍රයක් හෝ සනීපාරක්ෂක පහසුකම් නොමැති තාවකාලික නිවාසවල ජීවත්වීමට බල කෙරිණි. ඇතැම් පියවරු සිය පවුල් අනාථ කළහ; ඇතැම්හු මත්පැනට ඇබ්බැහි වූහ. වැඩ කරන පන්තියේ බොහෝ දරුවෝ වයස අවුරුදු 13 හෝ 14දී පාසල් හැර ගියහ. බොහෝ කාන්තාවෝ තමන්ම දරුවන් සහ නිවස රැකබලාගනිමින් කුඩා රැකියාවන් කළෝය.

අවපාතයට ගමන් කරමින් සිටි සමයේදී, රජයට මධ්‍යම රැකියා වියුක්ති වැඩසටහනක් නොතිබිණි. පුණ්‍යායතන හා ඇතැම් පෞද්ගලික සංවිධාන හැරුණු කොට, දුප්පත් මිනිසුන් හට පොදු වැඩ සහ රැකියා ව්‍යාපෘති මත රඳාපැවතීමට සිදු විය. 1932දී ආර්ථිකය දියුණුවීම ආරම්භ වූ නමුත්, බොහෝ අවස්ථාවලදී, පවුල්වලට වූ හානිය යථා තත්ත්වයට ගෙන ඒමට නොහැකි විය.

මහා අවපාත සමයේදී ඕස්ට්‍රේලියානු පුණ්‍යායතන සහ ස්වේච්ඡා සේවකයින්ගේ භූමිකාව අවධාරණය කෙරිණි.

මහා ආර්ථික අවපාත සමයේදී පවත්වාගෙන යන ලද සුප් සෑදීමේ මුළුතැන්ගෙයක්

ශ්‍රීමත් චාර්ල්ස් කින්ග්ස්ෆර්ඩ් ස්මිත් (1897-1935)

ශ්‍රීමත් චාර්ල්ස් කින්ග්ස්ෆර්ඩ් ස්මිත් මුල් කාලයේ සිටි ඕස්ට්‍රේලියානු ගුවන් නැවියෙකි. පළමු ලෝක යුද්ධයේදී, ඔහු ගැලිපොලිහිදී සටන් කළ අතර, බ්‍රිතාන්‍ය රාජකීය ගුවන් හමුදාවත් සමඟ පියාසර කළේය.

ඔහුගේ විශිෂ්ටතම ජයග්‍රහණය වූයේ, 1928දී කැලිෆෝනියාවේ සිට ක්වීන්ස්ලන්ඩ් වෙත පැසිෆික් සාගරය හරහා මුලින්ම ගුවන් යානාවක් පදවාගෙන යාමයි. සදර්න් ක්‍රොස් නම් ඔහුගේ ගුවන් යානය ඕස්ට්‍රේලියාවට පැමිණියේ 25,000ක පිරිසගේ ආදරණීය වීරයා වන ස්මිත්ට පල කරන ලද සුබපැතුම් මධ්‍යයේය. 1932දී,ගුවන් සේවය සඳහා සිදු කරන ලද සේවය වෙනුවෙන් ඔහුට නයිට් පදවියක් පිරිනැමිණි.

1935දී, එංගලන්තයේ සිට ඕස්ට්‍රේලියාවටගුවනින් එන අතරමගදී ගුවන් යානය අවාසනාවන්ත ලෙස කඩා වැටුණු අතර කිසිදාක සොයාගැනීමට නොහැකි විය.

ශ්‍රීමත් චාර්ල්ස් කින්ග්ස්ෆර්ඩ් ස්මිත් ලෝකයේ ශ්‍රේෂ්ඨතම ගුවන් යානා පදවන්නා ලෙස හැඳින්වෙන අතර, අවපාත සමයේදී මිනිසුන් වෙත ප්‍රදානය කිරීම වෙනුවෙන් සිහිපත් කෙරේ, සොයා බැලිය යුතු සත්‍ය ඕස්ට්‍රේලියානු වීරයෙකි.

දෙවන ලෝක යුද්ධය (1939-45)

දෙවන ලෝක යුද්ධයේදී, ඕස්ට්‍රේලියාව මිත්‍ර හමුදා සමඟ යුරෝපයේදී, මධ්‍යධරණී කලාපයේදී සහ උතුරු අප්‍රිකාවේදී ජර්මනියට එරෙහිව යුධ වැදුණේය. ඔවුන් ගිණිකොණ දෙසින් හා පැසිෆික් කලාපයේදී ජපානය සමඟ ද යුධ වැදුණි.

ඕස්ට්‍රේලියානු බල ඇණි උතුරු අප්‍රිකාවේ කාන්තාරවල ටොබෲක් නගරයේ ජර්මන් සහ ඉතාලි ජාතිකයින් ඇති කරන ලද දීර්ඝ අරගලය මැඩපවත්වන ලදී. එය ඊජිප්තුවේ ජර්මන් ජාතිකයන්ගේ කඳවුරට එරෙහි අවසන් ආරක්ෂක ප්‍රයත්නය විය. දීර්ඝ මාස අටක් පුරාවටම මෙම මිනිසුන් (බොහෝ ඕස්ට්‍රේලියානුවන්) ගුහාවල සහ විවරයන් තුළ වෙසෙමින්, දරුණු ප්‍රහාරවලට සහ කටුක තත්ත්වයන්ට මුහුණ දෙන ලදී. තම සේනාධිනායකයින්ගේ ආවේගශීලී උපක්‍රම සමඟ සංයුක්ත වූ ඔවුන්ගේ අධිෂ්ඨානය, නිර්භීත බව සහ හාස්‍යය, යුද්ධයේ සමහර අඳුරුතම දිනවලදී උද්යෝගය දනවන කරුණක් විය. එසේ සිදු කිරීමෙන් ඔවුන් ටොබෲක්හි මීයන් ලෙස ප්‍රසිද්ධියට පත්විය.

1941දී ජපන් ජාතිකයින් විසින් පැසිෆික්හි සිය යුද්ධය දියත් කරන ලදී. ඕස්ට්‍රේලියානු යුධ සෙබල සෙබලියෝ පැපුවා නිව් ගිනියාව ආරක්ෂා කිරීම සඳහා පිටත්ව ගියෝය. මෙම කාර්යය සාමාන්‍ය සෙබලුන්ට සහ නිසි පුහුණුවක් නොලද තරුණ රැදවි සොල්දාදුවන්ට භාර දෙන ලදී. ඔවුහු කොකෝඩා තීරය නමින් හඳුන්වන බෑවුම් සහිත මඩ වගුරුවලින් පිරි තීරයක් ඔස්සේ වනාන්තරයේ සිට සිය සතුරන්ට එරෙහිව සටන් වැදුණෝය. ඕස්ට්‍රේලියානු යුධ හමුදා කණ්ඩායම් විසින් කලින්ම ජපන් ජාතිකයින් නවතා සිටින ලදී. ගැලිපොලිහි ඇන්සැක් කෝව් මෙන්, ඇතැම් ඕස්ට්‍රේලියානුවන්ට කොකෝඩා තීරයද වන්දනාමාන කරන ස්ථානයක් බවට පත්ව තිබිණි.



කොකෝඩා තීරය මතදී
පැපුවා නිව් ගිනියානු ආධාරකරුවකුගේ උපකාර කරන ලද තුවාලලත් සෙබලෙක්

1942දී ජපාන ජාතිකයින් විසින් සිංගප්පූරුවේ පිහිටි බ්‍රිතාන්‍ය යුධ හමුදා කඳවුර අල්ලාගන්නා ලදී. අල්ලාගැනීමෙන් පසු තායි-බුරුම දුම්රිය මාර්ගය ඉදිකිරීමේ වැඩකටයුතු සඳහා ගෙනගිය පිරිස අතර, 15,000කට ආසන්න ඕස්ට්‍රේලියානු හමුදා කණ්ඩායම් ප්‍රමාණයක් සිටියේය. එහි ඉදිකිරීම් සිදු කරන කාලයේදී, බොහෝ ඕස්ට්‍රේලියානු හමුදා කණ්ඩායම් ජපන් ජාතිකයින්ගේ කෲර වධ හිංසාවට ලක් විය. ඕස්ට්‍රේලියානු යුධ සිරකරුවන් එකිනෙකා රැකබලාගැනීමට සිය හොඳම උත්සාහය දැරුවද, 2700කට අධික යුධ සිරකරුවෝ ප්‍රමාණයක් මිය ගියෝය.

ශ්‍රීමත් එඩ්වර්ඩ් වෙයරි ඩන්ලොප් (1907-93)

ශ්‍රීමත් එඩ්වර්ඩ් වෙයරි ඩන්ලොප් යනු නිර්භීත සහ මානුෂීය ශල්‍ය වෛද්‍යවරයෙකු මෙන්ම ඕස්ට්‍රේලියානු යුධ වීරයෙකි. දෙවන ලෝක යුධ සමයේදී, ජපන් ජාතිකයින් විසින් ඔහුව අල්ලාගෙන, තායි-බුරුම දුම්රිය මාර්ගය සෑදීමේ වැඩකටයුතුවලට බුරුමයට ගෙන යන ලදී. එය ඉතා දුෂ්කර කාර්යයක් විය.

සේනාධිනායකයෙකු ලෙස වෙයරි සිය මිනිසුන් වෙනුවෙන් කථා කළ අතර, ඔවුන්ගේ ශල්‍ය වෛද්‍යවරයා ලෙස, ඔවුන්ව සුව කිරීම සඳහා පැය ගණන් වෙහෙස වීය. ඔහුව කඳවුරේදී වධබන්ධනයට ලක් කළ නමුත්, අවංකව සේවය කිරීමට කැප වූයේය.

වෛද්‍ය වෘත්තිය වෙනුවෙන් සපයන ලද දායකත්වය උදෙසා 1969දී ඔහුට නයිට් පදවියක් පිරිනමන ලදී. ඔහු මියගිය අවස්ථාවේදී, 10,000කට වැඩි ජනතාවක් දුම්රිය මගේ ශල්‍ය වෛද්‍යවරයා නමින් හඳුන්වන ලද විරයාගේ රාජ්‍ය අවමංගල්‍යය වෙනුවෙන් මෙල්බර්න්හි වීදි පුරා පෙළ ගැසුණේය.

වෙනත් ගැටුම්

දෙවන ලෝක යුද්ධය අවසන් වී නොබෝ දිනකින්, 1950 සිට 1953 දක්වා කාලය තුළ ඕස්ට්‍රේලියානු සන්නද්ධ හමුදාවන් එක්සත් ජාතීන්ගේ බහුජාතික බලකායේ කොටසක් ලෙස යවන ලද්දේ, උතුරේ කොමියුනිස්ට් බලකායන්ගෙන් දකුණු කොරියාව ආරක්ෂා කිරීමටය.

වැඩි කාලයක් ගෙවී යන්නට මත්තෙන්, රට එක්සත් කරන ලෙස ඉල්ලා සිටි වියට්නාම් කොමියුනිස්ට් බලකායන්ට එරෙහිව දකුණු වියට්නාම් රජයට සහාය පල කරමින් ඕස්ට්‍රේලියාව ඇමෙරිකා එක්සත් ජනපදයට සම්බන්ධ විය. දෙවන ලෝක යුද්ධයෙන් පසුව ඕස්ට්‍රේලියාවේ විශාලතම ආයුධ සන්නද්ධ බලකායන් මෙහෙයුම් සිදු කළේ වියට්නාම් යුද්ධයේදීය. 1962 සිට 1973 දක්වා ඕස්ට්‍රේලියාව සටන් කළ එවකට පැවති දීර්ඝතම යුද්ධයද වූයේ එයයි. මෙය මතවාදයට තුඩුදුන් මැදිහත්වීමක් වූ අතර මෙම කරුණට විශේෂයෙන් තරුණ ඕස්ට්‍රේලියානු පිරිමි ළමයින් යුද්ධය තුළ රඳවාතබාගැනීමට එරෙහිව සිය විරෝධය පල කිරීමට බොහෝ ඕස්ට්‍රේලියානුවෝ වීදිවලට බටහ.

ඕස්ට්‍රේලියානු ආරක්ෂක අංශය නැගෙනහිර ටිමෝරයේ, ඉරාකයේ, සුඩානයේ සහ ඇෆ්ගනිස්ථානයේ ගැටුම්වලට සම්බන්ධ වී ඇති අතර, අප්‍රිකාව, මැද පෙරදිග සහ ආසියා-පැසිෆික් කලාපය ඇතුළු ලෝකයේ බොහෝ කොටස්වල එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම්වලට සහභාගි වී ඇත.

සිහිපත් කිරීමේ දිනය

ඇන්සැක් දිනය දා මෙන්ම, සිහිපත් කිරීමේ දින ඕස්ට්‍රේලියානුවෝ යුද්ධයේදී සේවය කර මිය ගිය අය පිළිබඳව ස්මරණය කරති. සෑම වසරකම නොවැම්බර් (11වන මාසයේ) 11වනදා පෙරවරු 11ට ඕස්ට්‍රේලියානුවෝ යුද්ධවලදී සහ ගැටුම්වලදී මියගිය හෝ තුවාල ලද පුරුෂයින් සහ කාන්තාවන් මෙන්ම ඒ වෙනුවෙන් සේවය කරන ලද අයගේ පරිත්‍යාගයන් සිහිපත් කිරීම සඳහා මොහොතක් නතර වෙති. එම දිනයේදී අපි රතු පොපි මලක් පලඳිමු.

1900 මුල් කාලයේදී සංක්‍රමණය වීම

පළමු ලෝක යුද්ධය සහ දෙවන ලෝක යුද්ධය අතර කාලසීමාව තුළ ඕස්ට්‍රේලියාවට ඇතුළු වීම සම්බන්ධයෙන් සීමාසහිත කොන්දේසි පැවතිණි. එසේ වුවද, පුද්ගලයින්, විශේෂයෙන් දකුණු යුරෝපයේ සිට පුරුෂයින්, සංක්‍රමණය වීමේ වැඩිවීමක් තිබිණි. ඔවුන් පැමිණියේ බොහෝ කුසලතා, අධ්‍යාපනය සහ ඔවුන්ගේම සංස්කෘතික සාරධර්ම ද රැගෙනය. ඔවුන් ඕස්ට්‍රේලියාවේ ග්‍රාමීය කර්මාන්ත සංවර්ධනය කිරීමට සහ මාර්ග හා දුම්රිය මාර්ග ඉදි කිරීමට සහාය ලබා දෙන ලදී. පොදු ගොඩනැගිලි සහ නිවාස ඉදිකිරීමේදී පුහුණුව ලත් ඉතාලි ජාතික ශෛල වැඩකරුවන්ගෙන් සුවිශේෂී දායකත්වයක් හිමි විය.

ඕස්ට්‍රේලියාවට පැමිණෙන සංක්‍රමණිකයෙක්

1930 ගණන්වල අවසානයේ, යුරෝපයේ සිට යුදෙව් සරණාගතයින් පැමිණීම ආරම්භ විය. ඔවුහු නාසි ජර්මනියේ තර්ජනවලින් පලා යමින් සිටියහ. ඔවුන් පැමිණියේ ජර්මනියේ, ඔස්ට්‍රියාවේ, චෙකොස්ලොවැකියාවේ, හංගේරියාවේ සහ පෝලන්තයේ සිටය. බොහෝ දෙනෙක් ඉහළට ඉගෙන ගත් අය වූ අතර, ඕස්ට්‍රේලියාවේ ආර්ථික සහ සංස්කෘතික දිවිය සඳහා විශාල වශයෙන් ඔවුහු දායක වූහ.

දෙවන ලෝක යුධ සමයේදී ග්‍රහණයට ගන්නා ලද ඉතාලි සොල්දාදුවන් ආසන්න වශයෙන් 18,000ක් ඕස්ට්‍රේලියාවේ යුධ කඳවුරුවල සිරකරුවන් ලෙස තබාගන්නා ලදී. ඔවුන් කෙටි කලක් පමණක් කඳවුරුවල නැවතී සිටින ලද නමුත්, ඔවුන්ට සාධාරණ ලෙස සලකන ලදී. බොහෝ දෙනෙක් මෙම භූමිය සහ පුද්ගලයින් පිළබඳව ඉගෙන ගත්හ. යුද්ධයෙන් පසුව, බොහෝ පුද්ගලයෝ සංක්‍රමණිකයින් ලෙස ඕස්ට්‍රේලියාවට නැවත පැමිණියහ.

පශ්චාත් යුධ සරණාගතයින්

යුද්ධයෙන් පසු, ජනගහනය වර්ධනය කිරීමේ අරමුණින් වෙනත් යුරෝපා රටවලින් සංක්‍රමණය වන ලෙස ඕස්ට්‍රේලියාව උනන්දු කළේය. මිලියන ගණනින් පුද්ගලයෝ නාසි ජර්මනියෙන් පලා ගොස් හෝ එවිට සෝවියට් රුසියාව විසින් අල්ලාගෙන තිබූ සිය මව් රටවලට නැවත යාමට නොහැකිව සිටියහ. ආසන්න වශයෙන් 170,000ක අවතැන් වූ පුද්ගලයින් නව දිවියක් ආරම්භ කිරීම සඳහා ඕස්ට්‍රේලියාවට පිළිගන්නා ලදී.

එකල ඕස්ට්‍රේලියාවේ උග්‍ර ශ්‍රම හිඟයක් පැවතිණි. එවකට සිටි රජය විශ්වාස කළේ රටේ අනාගතය සඳහා ජනගහන වර්ධනය අවශ්‍ය බවයි. වයස අවුරුදු 45ට අඩු නිරෝගී වැඩිහිටි සංක්‍රමණිකයින්ට පවුම් 10ක් ගෙවා ඕස්ට්‍රේලියාවට සංචාරය කළ හැකි වූ අතර, ඔවුන්ගේ දරුවන්ට නොමිලේ සංචාරය කළ හැකි විය. එසේ වුවත්, සංක්‍රමණිකයින් සිය බ්‍රිතාන්‍යහෝ යුරෝපා ජාතිකත්වයට සීමා කෙරිණි.

ස්නෝවි මවුන්ටන්ස් ජල විදුලි යෝජනා ක්‍රමය

1949දී, ස්නෝවි ගඟේ වතුර නැගෙනහිර වික්ටෝරියාවෙන් මුහුදට ගලායාමට පෙර නවතාලීමට රජය විසින් අවදානම්සහගත යෝජනා ක්‍රමයක් වෙනුවෙන් වැඩ ආරම්භ කරන ලදී. වාරිමාර්ග සඳහා අභ්‍යන්තරයට ගලා යාමට සහ විදුලි බලය ජනනය කිරීම සඳහා යොදාගැනීමට මෙම ජලය හරවන ලදී. එය, අවසන් කිරීමට වසර 25ක් ගත වූ විශාල ව්‍යාපෘතියකි.

එය ඕස්ට්‍රේලියාවේ විශාලතම ඉංජිනේරු ව්‍යාපෘතියයි. එය ලෝකයේ විශාලතම ජල විදුලි යෝජනා ක්‍රමවලින් එකක් ද වන අතර, ලෝකයේ නවීන සිවිල් ඉංජිනේරු විශ්මයන්ගෙන් එකක් ලෙසට හඳුනාගැනේ.

ස්නෝවි මවුන්ටන් යෝජනා ක්‍රමය නිව් සවුත් වේල්සයේ කොසියුස්කෝ ජාතික වනෝද්‍යානයේ පිහිටා ඇත. එය ප්‍රධාන වේලි 16කින්, බලාගාර හතක්, පොම්පාගාරයක් සහ කිලෝමීටර් 225ක් දිග උමං මාර්ග, ජලනල සහ ජලධරවලින් සමන්විත වේ. ඒවායින් බොහෝමයක් පොළොවට යටින් පිහිටා ඇත.

මෙම යෝජනා ක්‍රමය මගින් නිව් සවුත් වේල්ස් සහ වික්ටෝරියාහි අභ්‍යන්තර ගොවිපොලවල් වෙත අත්‍යවශ්‍ය ජලය සපයනු ලබයි. එහි බලාගාර මගින් නිව් සවුත් වේල්ස්හි සියයට 10ක් දක්වා විදුලිය ජනනය කරනු ලබයි.

1949දී මෙම යෝජනා ක්‍රමයේ වැඩ ආරම්භ කළ අතර, 1974දී වැඩ අවසන් විය. රටවල් 30කට වඩා වැඩි සංඛ්‍යාවකින් පැමිණි 100,000කට අධික පුද්ගලයෝ මෙම ව්‍යාපෘතියෙහි සේවය කළෝය. මෙම සේවකයින්ගෙන් සියයට හැත්තෑවක් සංක්‍රමණිකයෝ වූහ. මෙම ව්‍යාපෘතිය අවසන් වූ විට, බොහෝ යුරෝපා ජාතිකයෝ ඕස්ට්‍රේලියාවේ නතර වූ අතර, මෙරට බහුසංස්කෘතික සමාජය වෙත සිය වටිනා දායකත්වය දිගටම ලබා දුන්නෝය.

ස්වාධීන, බහුසංස්කෘතික හා සම්පත් පිරි රටක් ලෙස ඕස්ට්‍රේලියාවේ අනන්‍යතාව දක්වන වැදගත් සංකේතයකි, ස්නෝවි මවුන්ටන් යෝජනා ක්‍රමය.

ආදිවාසීන් වෙත දක්වන ලද සැලකීම

1940 සහ 1950 ගණන්වලදී, ආදිවාසීන් කෙරෙහි රජයේ ප්‍රතිපත්තිය පදනම් වූයේ අන්තර්ග්‍රහණය කරගැනීම මතය. මෙයින් අදහස් කළේ, ආදිවාසී ජනතාවට ආදිවාසී නොවන ජනතාව ජීවත් වන ආකාරයටම ජීවත් වන ලෙස ඉල්ලා සිටීමයි. මෙය ක්‍රියාකාරී නොවූයේ, ඔවුන්ට සිය සාම්ප්‍රදායික සංස්කෘතීන් නැතිකරගැනීමට අවශ්‍ය නොවූ නිසාය.

1960 ගණන්වලදී, මෙම ප්‍රතිපත්තිය අනුගතකිරීමකට වෙනස් කරන ලදී. ඕස්ට්‍රේලියාවේ බොහෝ පුරුෂයින්ට 1850 ගණන්වලදී ඡන්දය භාවිත කිරීමේ අයිතිය හිමි වුනමුත්, සියලුම ඇබොරිජිනල් ජනතාව වෙත 1962 වන තෙක් පොදුරාජ්‍ය මණ්ඩලීය ඡන්ද අයිතිය හිමි වූයේ නැත. මෙම අනුගතකිරීමේ කොටසක් ලෙස, ආදිවාසීන් වෙත සිවිල් නිදහස ලබා දුන් නමුත්, ඔවුන් ආදිවාසි නොවන ඕස්ට්‍රේලියානු සංස්කෘතියට අනුගතවීම අපේක්ෂා කරන ලදී.

1967දී, ඕස්ට්‍රේලියානුවන් සියයට අනූවකට වැඩි පිරිසක් මෙම ඓතිහාසික ජනමත විචාරණයේදී ඔව් ලෙස ඡන්දය පාවිච්චි කළ අතර, එමගින් ඕස්ට්‍රේලියාවේ වසර පහකට වරක් පැවැත්වෙන ජනගහන සහ නිවාස ලේඛනගත කිරීමේදී ආදිවාසීන් ගණන්ගැනීමට ඉඩ සලසන ලදී. එම සමයේදී ඕස්ට්‍රේලියානුවන් බහුතරයක් ආදිවාසීන්ට අන් අයට සේම සමාන අයිතීන් ලබාදිය යුතු බවට සිතන ලද බව මෙයින් පෙන්නුම් කරන ලදී.

සමාජයේ සාරධර්ම පුළුල් වීම හා ශක්තිමත් ඇබොරිජිනල් අරගල මගින් ස්වයං නිර්ණය කිරීමේ සංකල්පයට මගපෑදුණු අතර, එය ආදිවාසීන්ට අදාලව ප්‍රතිපත්ති සෑදීමේදී මූලික මගපෙන්වීමේ මූලධර්මයක් විය. ආදිවාසීන් සිය දේශපාලනික, ආර්ථික, සමාජීයය සහ සංස්කෘතික සංවර්ධනය පිළිබඳව හඬනැගීමෙහි ඇති වැදගත්කම රජය විසින් හඳුනාගන්නා ලදී.

1960 ගණන්වලදී නොදර්න් ටෙරිටරියේ වේව් හිල්හි ගුරින්ජි වැඩ වර්ජනය සමඟ ඉඩම් අයිතීන් පිළිබඳ අරගල මහජන අවධානය දිනාගන්නා ලදී. ගෙවීම් හා වැඩ කිරීමේ තත්ත්වයන්ට එරෙහිව වින්සන්ට් ලින්ජියාරි විසින් නායකත්වය ලබා දුන් ඇබොරිජිනල් සතුන් බලාගන්නෝ සත්ත්ව ගොවිපොලවලින් ඉවත්ව ගියහ. ඔවුන්ගේ ක්‍රියාකාරකම් එඩී මාබෝ සහ අනෙක් අයට ඉඩම් අයිතීන් වෙනුවෙන් සටන් කිරීමට මගපාදන ලදී.

1976 ඇබොරිජිනල් ඉඩම් හිමිකම් (නොදර්න් ටෙරිටරි) පනත යටතේ ඇබොරිජිනල් පුද්ගලයින් වෙත ඕස්ට්‍රේලියාවේ ඇතින් පිහිටි ඉඩම් කොටස් ප්‍රදානය කරන ලදී. 1990 මුල් කාලයේදී, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දෙන ලද මාබෝ නඩු තීන්දුව සහ *1993 ආදිවාසී හිමිකම් පනත* මගින් ආදිවාසීන්ට සිය සාම්ප්‍රදායික නීති සහ සිරිත් මත පදනම්ව භූමියකට හිමිකම් කිව හැකි බව හඳුනාගන්නා ලදී.

ඕස්ට්‍රේලියාවේ වැඩිවෙන භූමි ප්‍රමාණය ආදිවාසී හිමිකම් නිර්ණය කිරීම් මගින් ආවරණය කෙරේ. මේ ප්‍රදේශවල සාම්ප්‍රදායික සමාජයේ අංග දිගටම පැවතිණි.

1997 මැයි මාසයේදී, ඔවුන් නැවත නිවසට රැගෙන ඒම යන මැයෙන් වූ වාර්තාව ඕස්ට්‍රේලියානු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරිණි. මෙම වාර්තාව, ආදිවාසී පවුල් විශාල සංඛ්‍යාවකින් සිය දරුවන් උදුරාගෙනයාම පිළිබඳ විමර්ශණයක ප්‍රතිඵලය විය. මේ දරුවන් සොරාගත් පරම්පරාවන් (Stolen Generations) ලෙස හඳුන්වන ලදී. මෙම වාර්තාවේ ප්‍රතිඵලයක් ලෙස, 1998 පළමු ජාතික සමාව ඉල්ලීමේ දිනය දා ඕස්ට්‍රේලියානුවෝ දහස් ගණනක් එකට ගමන් කරමින් සිය මිත්‍ර ආදිවාසීන් වෙත සිය සහාය පල කළහ.

සොරාගත් පරම්පරාවන් (Stolen Generations) වෙත ජාතික වශයෙන් සමාව ඉල්ලීම (2008)

2008 පෙබරවාරි 13වන දින, ඕස්ට්‍රේලියානු අගමැතිවරයා පාර්ලිමේන්තුවේදී සියලුම ඕස්ට්‍රේලියානුවන් වෙනුවෙන් කථාවක් කරමින් සොරාගත් පරම්පරාවන් සම්බන්ධයෙන් ජාතියෙන් සමාව ඉල්ලා සිටියේය. අතීතයේ සිට ආදිවාසීන්ට සලකන ලද ආකාරය පිළිබඳව, විශේෂයෙන්ම ආදිවාසීන්ගේ දරුවන් ඔවුන්ගේ පවුල්වලින් උදුරාගෙන යාම පිළිබඳව ද අගමැතිවරයා විසින් සමාව ඉල්ලා සිටින ලදී.

මෙම කථාව රූපවාහිනියේ මෙන්ම ගුවන් විදුලිය මගින් ද ප්‍රචාරය කෙරිණි. මෙම සමාව ඉල්ලීමේ කථාවට සවන්දීම සඳහා ඕස්ට්‍රේලියානුවන් දහස් ගණනක් පොදු ස්ථානවලට සහ සිය සේවා ස්ථානවලට එක්රැස්වන ලදි. මෙම කථාවේ නිල වශයෙන් අතීතයේ සිදු කරන ලද අසාධාරණකම් පිළිබඳව සඳහන් කර, ඒ සඳහා සමාව ඉල්ලා සිටින ලදී. මෙය, ආදිවාසීන් වෙත සහනය ලබාදීමේ සහ මෙවැනි අසාධාරණ ක්‍රියා නැවත සිදු නොවන බව තහවුරු කරගැනීමට වැදගත් වූ පියවරක් විය. සමාව ඉල්ලීමේ කථාව සියලුම ඕස්ට්‍රේලියානුවන්ට වැදගත් වන ඉදිරි පියවරක් විය.

අහසේ රටා මවන්නෙකු සිඩ්නිවලට ඉහළින් "සමාවෙන්න" යැයි ලියයි

අද වන විට, ඕස්ට්‍රේලියානු අනන්‍යතාව උදෙසා ආදිවාසීන්ගේ අමිල දායකත්වය හඳුනාගෙන, පුළුල් ලෙස සැමරේ. බොහෝ ආදිවාසීහු අධිකරණ පද්ධතිය, දේශපාලනය, කලාවන් සහ ක්‍රීඩා ඇතුළු ඕස්ට්‍රේලියානු සමාජයේ ඉහළ තනතුරු දරති.

ඇල්බර්ට් නමජිරා (1902-59)

ඇල්බර්ට් නමජිරා ශ්‍රේෂ්ඨ ඕස්ට්‍රේලියානු කලාකරුවෙකු වූ අතර,ඕස්ට්‍රේලියානු භූමි දර්ශන සිතුවම් කිරීමෙහි ලා නව මගක් පෙන්වා දෙන ලද පුරෝගාමියෙකු විය. තරුණ ඇබොරිජිනල් පුද්ගලයෙකු ලෙස, ඇල්බර්ට් සිතුවම්කරණය සඳහා උපතින් ලද දායාදය පෙන්වීය. ඔහු සතුව සීමිත විධිමත් පුහුණුවක් තිබූ නමුත්, ඕස්ට්‍රේලියාව පිළිබඳ ඔහුගේ දියසායම් සිතුවම් ඉතා ජනප්‍රිය වූවාක් මෙන්ම ඉතා ඉක්මණින් අලෙවි විය.

ඔහු සහ ඔහුගේ බිරිඳ, ඕස්ට්‍රේලියාවේ පුරවැසියන් බවට පත්වීමට අවසර ලද පළමු ඇබොරිජිනල් පුද්ගලයින් වූ හ. මෙයින් අදහස් කළේ, ඔවුන්ට ඡන්දය පාවිච්චි කළ හැකි බවත්, හෝටලයකට ඇතුළු විය හැකි බවත් සහ ඔවුන් කැමති ස්ථානයක නිවසක් සෑදිය හැකි බවත්ය. ඇල්බර්ට්ගේ ඕස්ට්‍රේලියානු පුරවැසිභාවයෙන් අනෙක් ආදිවාසී ඕස්ට්‍රේලියානුවන් හට මෙම අයිතීන් නොමැති බව යන කරුණ මතු කර දක්වන ලදී.

ඔහුගේ දිවියෙන් ජාතිවාදී නීතිවල ඇති අසාධාරණ බව ආදිවාසී නොවන ඕස්ට්‍රේලියානුවන් වෙත පෙන්නුම් කරන ලද අතර, ආදිවාසී පුද්ගලයින් සඳහා සිදු කරන වෙනස් කිරීම් සඳහා දායකත්වය ලබා දෙන ලදී.

එඩී මාබෝ (1936-92)



එඩී කොයිකි මාබෝ, ආදිවාසී ඉඩම් අයිතීන් පිළිබඳ ක්‍රියාකාරිකයෙකු මෙන්ම කථිකයෙකි. ඔහු ඉපදුණේ ටොරස් ස්ට්‍රේට්හි මෙරියම්වාසීන්ගේ සාම්ප්‍රදායික භූමිය වන මරේ දූපත්හිය.

වසර ගණනක සිට කුමන ගස් හා පර්වත මගින් සිය පවුලේ භූමියේ සීමා සටහන් කෙරේද යන්න පිළිබඳව ඔහු නිශ්චිතවම දැන සිටියේය.

වසර ගණනාවකට පසු එඩී හට දැනගැනීමට ලැබුණේ ඔහුගේ මව් භූමිය රැජිණගේ භූමියක් ලෙස සලකන ලද බවත්, එය ඔහුගේ පවුලට අයත් නොවන බවත්ය. ඔහු සිය කෝපය ක්‍රියාවට හරවා මරේ දූපත්වාසීන් වෙනුවෙන් ඔහුගේ නඩුව අධිකරණය වෙත ගෙන යන ලදී.

වසර ගණනාවකට පසු, එනම් 1992දී, එඩීගේ නඩුව ශ්‍රේෂ්ඨාධිකරණයේදී ජය ගන්නා ලදී. මාබෝ තීරණය මගින් දැක්වෙන්නේ, ආදිවාසීන් හට සිය භූමියට ඓතිහාසික ලෙස හෝ දැනට පවතින සාම්ප්‍රදායික සම්බන්ධතාවක් පිළිබඳව සනාථ කළ හැකි නම්, එම භූමියේ අයිතිය ඉල්ලා නොමැති නම්, එහි අයිතිය ඉල්ලා සිටිය හැකි බවයි. මෙම තීරණය මගින් විශාල භූමි භාගයක් ඒවායේ මුල් අයිතිකරුවන් වෙත නැවත ලබාදීම අත්දැක ඇත.

එඩී මාබෝව සිය ධෛර්ය සහ ආදිවාසීන්ගේ ඉඩම් අයිතිය ලබාගැනීම වෙනුවෙන් සිහිපත් කෙරේ.

බහුසංස්කෘතික සංක්‍රමණය

1950 සහ 1960 ගණන්වලදී, බොහෝ ආසියානු, පල්ලි සහ වෙත් කණ්ඩායම් ඇතුළත් වර්ධනය වන කඳවුරක් විසින් ධවල ඕස්ට්‍රේලියා ප්‍රතිපත්තිය ඉවත් කරන ලෙස ඉල්ලා සිටින ලදී.

1958දී, රජය විසින් කියවන විට ලිවීමේ පරීක්ෂණය ඉවත් කර, 1966දී යුරෝපීය නොවන සහ නිපුණතාව සහිත ආසියානු සංක්‍රමණිකයින් තෝරාගැනීම ආරම්භ කරන ලදී. කෙමෙන් කෙමෙන්, සෑම පෙදෙසකම සිටි ඕස්ට්‍රේලියානුවෝ මෙරටේ සංක්‍රමණ වැඩසටහන සඳහා සියලුම ජාතීන් ඇතුළත්කරගැනීමේ වටිනාකම හඳුනාගත්හ.

1973දී ධවල ඕස්ට්‍රේලියා ප්‍රතිපත්තිය අවසන් කර, ඕස්ට්‍රේලිවාය බහුසංස්කෘතිකවාදී මාර්ගයට එළඹිණි. මේ කාලයේ සිට, රජය විසින් සංක්‍රමණය සඳහා පනවන ලද සියලුම ජාතිවාදී කාර්ය පටිපාටින් ඉවත් කරන ලදී. 1975දී, වියට්නාම් යුද්ධයෙන් පසුව, ඕස්ට්‍රේලියාව විසින් බොහෝ විට වියට්නාමය, චීනය සහ ඉන්දියාව වැනි රටවලින් වාර්තාගත ආසියානු සරණාගතයින් සහ සංක්‍රමණිකයින් සංඛ්‍යාවක් මෙරටට පිළිගන්නා ලදි.

1945 සිට යුද්ධයෙන් පීඩිත රටවල සිට පැමිණි සරණාගතයින් බොහෝදෙනෙක් ඇතුළුව මිලියන ගණනින් පුද්ගලයින් ඕස්ට්‍රේලියාවේ ජීවත්වීමට පැමිණ ඇත. අද වන විට, ලෝකයේ සෑම දෙසින්ම ඕස්ට්‍රේලියාවට සංක්‍රමණිකයින් පැමිණ ඇත.

ඕස්ට්‍රේලියාවේ ඉතාමත් ක්‍රියාකාරී අන්තර්කරණ ප්‍රතිපත්තියක් ඇති අතර, සෑම ජාතියකම, වාර්ගික කොටසකම හෝ සංස්කෘතියකම පුද්ගලයින් හට අපගේ සමාජයේ කොටසක් ලෙස හැඟීමක් ඇති විය හැකිය. රජයේ ප්‍රතිපත්ති ඇතුළු ඕස්ට්‍රේලියානු සමාජයේ සියලුම අංශවල මෙම ප්‍රතිපත්තිය අනුගමනය කෙරේ. එය, පූර්ව ළමා අවධියේ සිට විශ්වවිද්‍යාලය දක්වා අපගේ අධ්‍යාපන විෂය නිර්දේශය තුළ පිළිඹිබු වන අතර, සෑම සේවා ස්ථානයකදීම අනුගමනය කෙරේ.

ඕස්ට්‍රේලියානු මානව හිමිකම් කොමිසම සහ සෑම ප්‍රාන්තයකම හා ටෙරිටරියකම ඇති රජයේ වෙනස් කොට සැලකීමට එරෙහි නියෝජිතායතන මගින් සෑම පුරවැසියෙකුටම සමානව සැලකීමේ හා වෙනසක් රහිතව සැලකීමේ අයිතිය ආරක්ෂා කර ඇත. ජාතිවාදී ලෙස වෙනස් කොට සැලකීම ප්‍රසිද්ධියේ හෙළා දකින අතර, නීතිය යටතේ එය අපරාධයකි.

ඕස්ට්‍රේලියාව, සාමයෙන් හා පිළිගැනීමෙන් සමන්විත බහු සංස්කෘතික සමාජයක් බවට පත්ව ඇත. සංක්‍රමණිකයින්, ආදිවාසීන් සහ ඕස්ට්‍රේලියාවේ උපත ලද සියලුදෙනාටම සාමකාමීව සිය අරමුණු ළඟාකාරගැනීමට බිය නොවිය යුතු රටකි මෙය.

වෛද්‍ය වික්ටර් චැන්ග් (1936-91)

වෛද්‍ය වික්ටර් චැන්ග් ඕස්ට්‍රේලියාවේ සිටි හොඳම හදවත් ශල්‍ය වෛද්‍යවරුන්ගෙන් කෙනෙකි. වික්ටර් පීටර් චැන්ග් යෑම් හිම් 1936දී චීනයේ උපත ලද අතර, ඔහුට වයස අවුරුදු 15දී ඕස්ට්‍රේලියාවට පැමිණියේය.

ඔහු සිඩ්නිහි ශාන්ත වින්සන්ට් රෝහලේ සේවය කරන ලද අතර, 1984දී ඕස්ට්‍රේලියාවේ පළමු හදවත් බද්ධ කිරීමේ මධ්‍යස්ථානය පිහිටුවන ලදී. 1986දී වික්ටර් ඕඩර් ඔෆ් ඕස්ට්‍රේලියාහි කොටස්කරුවෙකු බවට පත් කරන ලදී.

දායකයින්ගේ අඩුවක් පිළිබඳව සැලකිලිමත් වූ වික්ටර් කෘත්‍රිම හදවතක් නිර්මාණය කිරීම ආරම්භ කරන ලද අතර, 1991දී දුක්ඛිත ලෙස ඔහු මිය යන විට එය සෑහෙන දුරකට අවසන් කර තිබිණි.

ඔහුව සිහිපත් කිරීම සඳහා නව පරේයේෂණ මධ්‍යස්ථානයක් පිහිටුවා ඇත. සිය ප්‍රාගුණ්‍යය, සුබවාදී බව සහ නව නිපැයුම් සම්බන්ධයෙන් ඔහුව සිහිපත් කෙරේ.

අවසානය

මෙම පිටු මගින් අපේ ඕස්ට්‍රේලියානු වෘත්තාන්තයේ අංශු මාත්‍රයක් පමණක් ලබා දී ඇත. ඕස්ට්‍රේලියානු පුරවැසිභාවය සඳහා අපි ඔබව පිළිගන්නා අතර, අපගේ සාමකාමී ප්‍රජාතන්ත්‍රවාදී රට තුළ පූර්ණ සහභාගිත්වය ලබා දිම සඳහා ආරාධනා කරමු.

පුරවැසියෙකු ලෙස ඔබ අන් පුරවැසියන් සේම සමාන වගකීම් සහ වරප්‍රසාද ලබාගන්නා සේම ඕස්ට්‍රේලියානු සමාජය තුළ පූරුණ සාමාජිකයෙකු ලෙස ඔබගේ ස්ථානය ලබා ගනී. ඕස්ට්‍රේලියාවේ අනාගතය හැඩගැස්වීමට උදව්වීමේ වගකීම ඔබ විසින් බෙදාහාදාගන්නා අතරේම, මෙම ජාතික ව්‍යාපෘතියෙහි ඔබගේ සක්‍රීය දායකත්වය වෙනුවෙන් අපි මග බලා සිටිමු.

විභාග නොකරන කොටසේ පාරිභාෂිතය

තානාපතිවරයා
රටක් හෝ ක්‍රියාකාරකමක් නියෝජනය කරනු ලබන හෝ ප්‍රවර්ධනය කරනු ලබන පුද්ගලයෙකු

මණ්ඩලය
උදාහරණයක් ලෙස, සමාගමක් පාලනය කළ යුත්තේ කෙසේද යන්න පිළිබඳව තීරණය කිරීම සඳහා තෝරාගන්නා ලද පුද්ගලයින් කණ්ඩායමක්

නේවාසික පාසැල
පාසැලේ ජීවත්වන, මුළු පාසැල් කාලය පුරාවටම නිවෙස් බලා නොයන සිසුන් සිටින පාසැලක්

පඳුරු සහිත ගම්මාන පෙදෙස්
ඕස්ට්‍රේලියාවේ තවමත් ස්වාභාවිකව පවතින ගම්මාන ප්‍රදේශ

ගව පට්ටිය
ගවයින් ඇති කරන විශාල ගොවිපොලක්

සම්මුතිය
අයිතීන් හා වගකීම් පිළිබඳ විධිමත් ලිඛිත ලියවිල්ල

පොදු විෂයයන්
සමාන උනන්දුවක් සහිත විෂයයන්

බලහත්කාර සොල්දාදුවා
ආරක්ෂක හමුදාවට බැඳීමට තීරණය නොකළ, එහෙත් යුධ සමයකදී හමුදාවට බැඳීමට සිදු වූ සෙබලෙකු

රැජිණට අයත් භූමිය
රජයට අයත් භූමිය

විෂය නිර්දේශය
අධ්‍යයන පාඨමාලාවක විෂයයන් හා මාතෘකා

අසරණ
මුදල් නොමැතිකම හෝ මුදල් ලබාගැනීමට මගක් නොමැති වීම

ඩිගෙරිඩෝ
ඇතුළතින් දිග සිදුරක් සහිතව ඕස්ට්‍රේලියානු ආදිවාසීන් විසින් සාදන සංගීත භාණ්ඩයකි

සාධාරණත්වය
නීති අනුගමනය කිරීම සහ අනිසි ප්‍රයෝජන නොගැනීම; මිනිසුන්ට සාධාරණව හා අවංකව සැලකීම

මියගිය සෙබලුන් සහ සෙබලියන්
යුද්ධයකදී හෝ අරගලයකදී මියගිය සෙබලුන් සහ සෙබලියන්

ද්‍රව්‍ය උණුකර නිර්මාණය කිරීම
ගොඩනැගීම හෝ නිර්මාණය කිරීම

දළ දේශීය නිෂ්පාදිතය
වසරකදී රට තුළ නිපදවනු ලබන සියලුම භාණ්ඩ හා සේවාවන්හි අගය

අධිතාප කාලගුණය
එක දිගට දින දෙකකට වඩා පවතින අධි උණුසුම් කාලගුණික තත්ත්වය

දරුණු රාජද්‍රෝහීභාවය
රජය නෙරපාහැරීම සඳහා ප්‍රයත්නයක් ඇතුළත් අතිශයින් දරුණු අපරාධමය වරදක්

සංකේතය
ජනප්‍රිය සහ නියෝජනය කෙරෙන පින්තූරයක්

සුවිශේෂී ආදිවාසී චිත්‍ර
ආදිවාසීන් හට ආවේණික සහ ඔවුන් නියෝජනය කරන කලාව

ආදිවාසීන්
ඕස්ට්‍රේලියාවේ ආදිවාසීන්

භූමි භාගය
විශාල භූමිභාගයක්

සන්ධිස්ථානය
වැදගත් ඓතිහාසික සිදුවීමකි

ආවේණික අයිතිය
ඕස්ට්‍රේලියානු නීති පද්ධතිය තුළ තීරණය කර ඇති භූමියට සහ ජලයට ආදිවාසීන් සතු සාම්ප්‍රදායික අයිතිය

වාචික ඉතිහාසය
අතීතයේ සිදුවූයේ කුමක්ද යන්න පිළිබඳව මිනිසුන්ගේ වාචික මතකය

පුරෝගාමියා
යටත් විජිත සමයේ මුල් දිනවලදී ලාභියෙකු වූ මුල්ම පදිංචිකරුවන්ගෙන් එක් අයෙකු

දේශපාලන නියෝජනය
පාර්ලිමේන්තුවේදී දේශපාලනඥයෙකු විසින් නියෝජනය කෙරෙන

දඬුවම
අපරාධයකට වරදකරුවෙකු කරන ලද පුද්ගලයෙකු සිරගත කරන කාලසීමාව ඇතුළුව විනිශ්චයකාරවරයෙකු විසින් තීරණය කරන දඬුවම

වැටුප් තීරණය කිරීමට
සිය වැඩ සඳහා සේවකයින්ට කොපමණ ගෙවිය යුතුද යන්න තිරණය කිරීමට

සමාජ ප්‍රතිසංස්කරණ
අරගල නොමැතිව සෙමින් සෙමින් සමාජය සංවර්ධනය කරමින්

රාජ්‍ය අවමංගල්‍ය උත්සව
ජාතිය වෙනුවෙන් වැදගත් දායකත්වයක් දැක්වූ පුරවැසියෙකු වෙත ගෞරව කිරීම සඳහා රජය විසින් වියදම් දරන ලද අවමංගල්‍ය උත්සවයක්

දඬුවැට
දැව්වලින් සාදන ලද ආරක්ෂක වැස්මක්

සතුන් රැකබලාගන්නන්
පිරිමින් ගවයින් බලාගැනීම සඳහා යෙදවිණි

වැඩ වර්ජනය
සේවකයින් වැඩකිරීම නතර කළ විට, උදාහරණයක් ලෙස, සිය වැටුපට හෝ වැඩ කිරීමේ කොන්දේසිවලට එරෙහින අරගල කිරීම සඳහා

සර්වජන ඡන්ද බලය
මහජන මැතිවරණවලදී ඡන්දය පාවිච්චි කිරීමේ අයිතිය

දිවුරුම් දෙන ලද
නිල උත්සවයකදී රජයේ කාර්යාලය සඳහා පිළිගැනීමට

ජීවන වෘත්තාන්තය
සමාජ තත්ත්වය හෝ පසුබිම, රැකියාව, නිලය

තවත් තොරතුරු සඳහා

ඕස්ට්‍රේලියානු පුරවැසිභාවය

ඕස්ට්‍රේලියානු පුරවැසියෙකු වන්නේ කෙසේද යන්න පිළිබඳ තවත් තොරතුරු සඳහා, www.citizenship.gov.au වෙත පිවිසෙන්න.

ඕස්ට්‍රේලියාව

ඔබට ඕස්ට්‍රේලියාව පිළිබඳ තවත් තොරතුරු ඔබේ ප්‍රදේශයේ පුස්තකාලයෙන් ලබා ගත හැකිය. පහත සඳහන් වෙබ් අඩවිවලද ප්‍රයෝජනවත් තොරතුරු තිබිය හැක:

- ඕස්ට්‍රේලියාව පිළිබඳ www.australia.gov.au
- ඕස්ට්‍රේලියාව පිළිබඳ කෙටියෙන් www.dfat.gov.au

ඕස්ට්‍රේලියානු රාජ්‍ය වැඩසටහන් හා සේවාවන්

ඕස්ට්‍රේලියානු රාජ්‍ය වැඩසටහන් හා සේවාවන් තවත් තොරතුරු සඳහා www.australia.gov.au වෙබ් අඩවියට පිවිසෙන්න

ෆෙඩරල් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා හෝ සෙනෙට් සභිකයා

ඕස්ට්‍රේලියානු රාජ්‍ය වැඩසටහන් හා සේවාවන් පිළිබඳ තොරතුරු රැසක් ඔබේ ප්‍රාදේශීය ෆෙඩරල් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා හෝ ඔබේ ප්‍රාන්තය හෝ ටෙරිටරිය නියෝජනය කරන සෙනෙට් සභිකයා සතුව ඇත.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ හා සෙනෙට් සභිකයින්ගේ ලැයිස්තුවක් www.aph.gov.au හි දැක්වේ.

ඕස්ට්‍රේලියානු රාජ්‍ය සංවිධාන

මෙම සම්පත් පොතෙහි සඳහන් රාජ්‍ය සංවිධාන පිළිබඳ තවත් තොරතුරු සඳහා පහත සඳහන් වෙබ් අඩවිවලට පිවිසෙන්න

- ඕස්ට්‍රේලියානු ආරක්ෂක හමුදාව www.defence.gov.au
- ඕස්ට්‍රේලියානු මැතිවරණ කොමිසම www.aec.gov.au
- ඕස්ට්‍රේලියානු ෆෙඩරල් පොලීසිය www.afp.gov.au
- ඕස්ට්‍රේලියානු මානව හිමිකම් කොමිසම www.humanrights.gov.au
- ඕස්ට්‍රේලියානු ක්‍රීඩා කොමිසම www.sportaus.gov.au
- ඕස්ට්‍රේලියානු බදුකරණ කාර්යාලය www.ato.gov.au
- ඕස්ට්‍රේලියානු යුධ අනුස්මරණ ස්මාරකය www.awm.gov.au
- ඕස්ට්‍රේලියා මහ බැංකුව www.rba.gov.au

රාජ්‍ය නොවන සංවිධාන

මෙම සම්පත් පොතෙහි සඳහන් රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ තවත් තොරතුරු සඳහා පහත සඳහන් වෙබ් අඩවිවලට පිවිසෙන්න

- බ්‍රැඩ්මන් පදනම ඕස්ට්‍රේලියාව www.bradman.com.au
- හැම්ලින් ෆිස්ටුලා www.hamlinfistula.org
- ඕස්ට්‍රේලියානු රාජකීය ගුවන් වෛද්‍ය සේවය www.flyingdoctor.org.au
- ගුවන් පාසැල www.schoolair-p.schools.nsw.edu.au
- ස්නෝවි කන්දෙහි පිහිටි ජල විදුලි අධිකාරිය www.snowyhydro.com.au
- ෆ්‍රෙඩ් හොලෝස් පදනම www.hollows.org
- යුනෙස්කෝ ලෝක උරුම මධ්‍යස්ථානය whc.unesco.org
- එක්සත් ජාතීන්ගේ සංවිධානය www.un.org
- වික්ටර් චැන්ග් හෘදරෝග පරේයේෂණ ආයතනය www.victorchang.edu.au
- ඕස්ට්‍රේලියාවේ ස්වේච්ඡා සේවයෙ නිරතවීම www.volunteeringaustralia.org

වෙනත්

පහත සඳහන් මාතෘකා පිළිබඳව වැඩිදුර තොරතුරු සඳහා පහත සඳහන් වෙබ් අඩවිවල සොයන්න:

- ඕස්ට්‍රේලියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව www.aph.gov.au
- වසරේ ඕස්ට්‍රේලියානුවා සම්මාන www.australianoftheyear.org.au
- “ඔවුන් නැවත රැගෙන ඒම” පිළිබඳ වාර්තාව www.humanrights.gov.au
- රාජ්‍ය උද්‍යාන සහ රක්ෂිත www.environment.gov.au
- මාර්ගගත ආරක්ෂාව www.esafety.gov.au
- ගෘහස්ථ හෝ පවුල් ප්‍රචණ්ඩත්වය උපකාර www.respect.gov.au, www.1800respect.org.au, www.dss.gov.au/women/help-is-here-campaign
- ජනප්‍රිය ඕස්ට්‍රේලියානුවන්: ඕස්ට්‍රේලියානු ජීවන පුරාවෘත්ත එකතුව adb.anu.edu.au
- පාර්ලිමේන්තුව ඉදිරියේ දැනට ඇති පනත් කෙටුම්පත්වල ලැයිස්තුව www.aph.gov.au
- ඕස්ට්‍රේලියානු පාර්ලිමේන්තුව www.aph.gov.au
- පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ අධ්‍යයන කාර්යාලය www.peo.gov.au
- රජයේ නිවාඩු www.australia.gov.au
- වර්ගවාදය: humanrights.gov.au
- ඇබොරිජිනල් හා ටොරස් ස්ට්‍රේට් අයිලන්ඩර්වාසීන්ගෙන් සමාව අයැදීම www.australia.gov.au

හඳුන්වාදීම්

පහත සඳහන් ඡායාරූප කෘෂිකර්ම, ජලය සහ පරිසර දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයෙන් ලැබිණි:

පිටු අංක 50	තස්මේනියානු වනගහණය

පහත සඳහන් ඡායාරූප පුරවැසි සහ සංක්‍රමණ දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයෙන් ලැබිණි:

පිටු අංක 5	කැන්බරාහි ඇල්බර්ට් ශාලාවේ පවත්වන ලද පුරවැසිභාවය ලබාදීමේ උත්සවය
පිටු අංක 5	ඕස්ට්‍රේලියානු පුරවැසි සහතිකය
පිටු අංක 11	දුම් ගැසීමේ උත්සවය, කැන්බරා
පිටු අංක 34	කැන්බරාහි පවත්වන ලද ඕස්ට්‍රේලියානු පුරවැසිභාවය ලබාදීමේ උත්සවයකට සහභාගි වූ පවුලක්

පහත සඳහන් ඡායාරූප ඕස්ට්‍රේලියාවේ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයෙන් ලැබිණි:

පිටු අංක 51	නිව් සවුත් වේල්ස්හි බැටලුවන් ගැවසෙන ඉඩමක සිටින ළමුන් - ගුවන් පාසැල, ඡායාරූපය ගන්නා ලද්දේ 1962දීය(යොමු අංකය: A1200:L42511)
පිටු අංක 60	ඩික් ස්මිත්, සිවිල් ගුවන් සේවා අධිකාරියේ සභාපති, 1991 (යොමු අංකය: A6135:K23/5/91/1)
පිටු අංක 65	අබෙල් ටැස්මන්ගේ නව ඕලන්ද සිතියම, 1644 (යොමු අංකය: A1200:L13381)
පිටු අංක 68	1851දී ඕස්ට්‍රේලියාවට රන් සොයා පැමිණීමේ ඓතිහාසික සේයාරුව (යොමු අංකය: A1200:L84868)
පිටු අංක 70	ඕස්ට්‍රේලියාවේ ග්‍රාමීය ප්‍රදේශවල සිටින "ඇෆ්ගන්" ජාතික ඔටුවන් පිට යන්නන් (යොමු අංකය: A6180:25/5/78/62)
පිටු අංක 77	ශ්‍රීමත් එඩ්වර්ඩ් "වෙයරි" ඩන්ලොප් සිය කාර්යාලයේදී, 1986 (යොමු අංකය: A6180:1/9/86/12)
පිටු අංක 78	ඕස්ට්‍රේලියාවට පැමිණෙන යුරෝපා සංක්‍රමණිකයින්, කෙයාර්න්ස්හි ෆ්ලැමිනියා වෙත ඉතාලියානු උක්වතු සේවකයින් නංවමින්, 1955 (යොමු අංකය: A12111:1/1955/4/97)

පහත සඳහන් ඡායාරූප ඕස්ට්‍රේලියානු ජාතික පුස්තකාලයේ අනුග්‍රහයෙන් ලැබිණි:

පිටු අංක 53	ජූඩිත් රයිට්ගේ චිත්‍රය, 1940 ගණන්වලදී ප්‍රකාශයට පත් කරන ලද, (යොමු අංකය: nla.pic-an29529596)
පිටු අංක 65	සිඩ්නි කෝව් වෙත පැමිණි පළමු බල ඇණිය, 1788 ජනවාරි, ජෝන් ඕල්කොට් විසින් 1888-1973 අතර නිර්මාණය කරන ලද (යොමු අංකය: nla.pic-an7891482)
පිටු අංක 66	කැරොලින් චිෂොම්ගේ චිත්‍රය , 1804-1852 අතර තෝමස් ෆෙයාර්ලන්ඩ් විසින් ප්‍රකාශයට පත් කරන ලද, (යොමු අංකය: nla.pic-an9193363)
පිටු අංක 71	කැතරින් හෙලන් ස්පෙන්ස්ගේ චිත්‍රය , 1980දී ප්‍රකාශයට පත් කරන ලද, (යොමු අංකය: nla.pic-an14617296)
පිටු අංක 74	ජෝන් සිම්ප්සන් කර්කපැට්රික් සහ ඔහුගේ බූරුවා, ගැලිපොලි, 1915, (යොමු අංකය: nla.pic-an24601465)
පිටු අංක 76	ශ්‍රීමත් චාර්ල්ස් එඩ්වර්ඩ් කිංග්ස්ෆර්ඩ් ස්මිත්, 1919 හා 1927 අතර ප්‍රකාශයට පත් කරන ලද, (යොමු අංකය: nla.pic-vn3302805)
පිටු අංක 81	නොදර්න් ටෙරිටරිහි හර්මන්ස්බර්ග් මිෂනාරියේ ඇති ඇල්බර්ට් නමජිරාගේ චිත්‍රය, ආතර් ග්‍රෑම් විසින් 1946දී හෝ 1947දී ප්‍රකාශයට පත් කරන ලද, (යොමු අංකය: nla.pic-an23165034)

පහත සඳහන් ඡායාරූප අයිස්ටොක්හි අනුග්‍රහයෙන් ලබා දෙන ලදී:

කවරය	වසන්ත ඍතුවේ මිමෝසා මල්, ©iStockphoto.com/ST-art (යොමු අංකය: 1135566007)
පිටු අංක 6	ලකී බේහි කැන්ගරු මව හා ජෝයි, බටහිර ඕස්ට්‍රේලියාව, ©iStockphoto.com/NeoPhoto (යොමු අංකය: 1142608453)
පිටු අංක 9	හියුම් විල, වික්ටෝරියා, ©iStockphoto.com/tsvibrav (යොමු අංකය: 675826394)
පිටු අංක 15	ඕස්ට්‍රේලියානු ඕපල්, ©iStockphoto.com/Alicat (යොමු අංකය: 173691056)
පිටු අංක 17	ඕස්ට්‍රේලියානු ධජය, ©iStockphoto.com/davidf (යොමු අංකය: 471630390)

පිටු අංක 19	බහු වාර්ගික ප්‍රාථමික පාසල් ගැහැණු ළමුන් කණ්ඩායමක්, ©iStockphoto.com/FatCamera (යොමු අංකය: 877714382)
පිටු අංක 23	ඕස්ට්‍රේලියානු පාර්ලිමේන්තු නිවස, කැන්බරා, ©iStockphoto.com/felixR (යොමු අංකය: 157193181)
පිටු අංක 33	මිනිසුන් සමූහය, ©iStockphoto.com/davidf (යොමු අංකය: 913541808)
පිටු අංක 36	නීතියේ දෙවඟන මූර්තිය, ©iStockphoto.com/studiocasper(යොමු අංකය: 1004781908)
පිටු අංක 37	ඩයිවර්ස් සමූහය, ©iStockphoto.com/SolStock (යොමු අංකය: 1203934273)
පිටු අංක 39	පිටුව ග්‍රීන් වොට්ල් ක්‍රීක් ගින්න NSW, ඕස්ට්‍රේලියාව, 2019 දෙසැම්බර්, © iStockphoto.com PetarBelobrajdic (ref: 1198579743)
පිටු අංක 47	දෑතින් පින්තාරු කරන ලද ඩිජෙරිඩූ, ©iStockphoto.com/lore (යොමු අංකය: 185011099)
පිටු අංක 48	බොන්ඩයි වෙරළ, සිඩ්නි, ©iStockphoto.com/Edd Westmacott (යොමු අංකය: 91095176)
පිටු අංක 49	සිඩ්නි ඔපෙරා හවුස්, නිව් සවුත් වේල්ස්, ©iStockphoto.com/slowstep (යොමු අංකය: 607986870)
පිටු අංක 50	උලුරු-කාටා යුටා ජාතික වනෝද්‍යානය, නොදර්න් ටෙරිටරි, ©iStockphoto.com/bennymarty (යොමු අංකය: 1184425004)
පිටු අංක 63	උලුරු, නොදර්න් ටෙරිටරි, ©iStockphoto.com/simonbradfield (යොමු අංකය: 539027478)
පිටු අංක 64	ඇබොරිජිනල් ශෛල කලාවන් - සරටෝගා මාළුවා, ©iStockphoto.com/Alpen Gluehen (යොමු අංකය: 2761924)
පිටු අංක 75	ඕස්ට්‍රේලියානු යුධ අනුස්මරණ ස්මාරකයේ බිත්ති, කැන්බරා, ©iStockphoto.com/Matt Palmer (යොමු අංකය: 1125736631)

පහත සඳහන් ඡායාරූප ෂටර්ස්ටොක් අනුග්‍රහයෙන් ලබා දෙන ලදී:

පිටු අංක 7	සිඩ්නිහි හෝම්ග්‍රවුන්ඩ් උත්සවයේ ආදිවාසී නර්තන ශිල්පීන් ©shutterstock.com/PomInOz (යොමු අංකය: 345113882)
පිටු අංක 21	වෝටර්, ©shutterstock.com/Nils Versemann (යොමු අංකය: 446229916)
පිටු අංක 31	ඕස්ට්‍රේලියානු ශ්‍රේෂ්ඨාධිකරණය, ©shutterstock.com/Greg Brave (යොමු අංකය: 1051621895)

අනෙක් සියලුම ඡායාරූප පහත සඳහන් සංවිධාන/පුද්ගලයින්ගේ අනුග්‍රහයෙන් ලබා දෙන ලදී:

පිටු අංක 24	1900 පොදුරාජ්‍ය මණ්ඩලීය ඕස්ට්‍රේලියා පනත: මුල් මහජන වාර්තා පිටපත, ඡායාරූප අනුග්‍රහය ත්‍යාග එකතුව, පාර්ලිමේන්තු නිවසේ චිත්‍ර එකතුව, පාර්ලිමේන්තු සේවා දෙපාර්තමේන්තුව, කැන්බරා ඒසීටී
පිටු අංක 40	හර්ඩ් දිවයින සහ මැක්ඩොනල්ඩ් දිවයින, ඡායාරූප අනුග්‍රහය ඕස්ට්‍රේලියානු ඇන්ටාර්ක්ටික් අංශය © පොදුරාජ්‍ය මණ්ඩලීය ඕස්ට්‍රේලියා, ඡායාරූපය එල්.ඊ.ලාර්ජ් විසිනි (යොමු අංකය: 1892A2)
පිටු අංක 52	ශ්‍රීමත් ඩොනල්ඩ් බ්‍රැඩ්මන්, ඡායාරූප අනුග්‍රහය බ්‍රැඩ්මන් ක්‍රිකට් කෞතුකාගාරය 1931-32 ක්‍රිකට් සමය තුළ ගන්නා ලද, සිය ඕස්ට්‍රේලියානු ටෙස්ට් ක්‍රිකට් ක්‍රීඩා හිස් ආවරණය පැළඳ සිටින ශ්‍රීමත් ඩොනල්ඩ් බ්‍රැඩ්මන්
පිටු අංක 54	පිටුව ආචාර්ය ෆියෝනා වුඩ් ඒඑම් අනුග්‍රහය ජාතික ඕස්ට්‍රේලියානු දින කවුන්සිලයේ අනුග්‍රහයෙනි
පිටු අංක 55	මහාචාර්ය ෆ්‍රෙඩ් හොලෝස්, ඡායාරූප අනුග්‍රහය ෆ්‍රෙඩ් හොලෝස් පදනම, ඡායාරූපය ෆ්‍රැන්ක් වියෝලි විසිනි
පිටු අංක 61	වෛද්‍ය කැතරින් හැම්ලින් ඒසී, ඡායාරූප අනුග්‍රහය හැම්ලින් ෆිස්ටුලා සහන සහ ආධාර පදනම
පිටු අංක 71	ෆෙඩරේෂණ දින සෙනඟ අමතන ලැමින්ටන් සාමිවරයා, බ්‍රිස්බේන්, 1901, ඡායාරූප අනුග්‍රහය, ක්වීන්ස්ලන්තය ප්‍රාන්ත පුස්තකාලය, ඡායාරූපය එච්.ඩබ්ලිව්.මොබ්ස්බි විසිනි (යොමු අංකය: 47417)
පිටු අංක 72	පිටුව එඩිත් කෝවන් ඡායාරූප අනුග්‍රහය ඕස්ට්‍රේලියාවේ ජාතික කෞතුකාගාරය
පිටු අංක 73	පිටුව ඩොරතිය මැකෙලර් ඡායාරූප අනුග්‍රහය එන්එස්ඩබ්ලිව් රාජ්‍ය පුස්තකාලයේ අනුග්‍රහයෙනි
පිටු අංක 76	සුප් පිළියෙල කරනු ලබන මුළුතැන්ගෙය, ඡායාරූප අනුග්‍රහය නිව් සවුත් වේල්ස් ප්‍රාන්ත පුස්තකාලය (මිචෙල් පුස්තකාලය) නොමිලේ ලබා දෙන සුප් සහ පාන් පෙත්තක් ලබා ගැනීමට පෙළ ගැසී සිටින පාසැල් දරුවන්, උතුරු බෙල්මෝර් රජයේ පාසැල, නිව් සවුත් වේල්ස්, 1934 අගෝස්තු 2, ඡායාරූපය සෑම් හුඩ් විසිනි (යොමු අංකය: H&A 4368)
පිටු අංක 77	කොකෝඩා තීරය මත තුවාල ලද සෙබලෙක්, අනුග්‍රහය ඕස්ට්‍රේලියානු යුධ අනුස්මරණ ස්මාරකය
පිටු අංක 81	බර්නිටා සහ ගේල් මාබෝගේ අනුමැතිය සහිතව ප්‍රතිනිර්මාණය කරන ලදි
පිටු අංක 82	වෛද්‍ය වික්ටර් චැන්ග්, ඡායාරූප අනුග්‍රහය වික්ටර් චැන්ග් හෘද පරේෂණ ආයතනය

සටහන්